## 2022/08/09 දින පැවති මහාසභා රැස්වීම් වාර්තාව

2022/08/09 දින පෙ.ව. 09.30 ට නාගොඩ ප්‍රදේශීය සභා රැස්වීම් ශාලාවේදී රැස්වීම පවත්වන ලදී.

**සහභාගී වූ**

| | | |
|---|---|---|
| 1. | නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා | ගරු සභාපති |
| 2. | එම්.කේ. ගාමිණී සුසන්ත මහතා | ගරු උප සභාපති |
| 3. | ඒ.එච්.වී. අජිත් කුමාර මහතා | ගරු මන්ත්‍රී |
| 4. | ඩබ්. ජී. නිශාන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 5. | සී.වී. සහබන්දු මහතා | ගරු මන්ත්‍රී |
| 6. | බන්දුල සමන්ත හිරිමුතුගොඩ | ගරු මන්ත්‍රී |
| 7. | එච්.ජී. තරංග සුදර්ශන මහතා | ගරු මන්ත්‍රී |
| 8. | කුමාරගේ වසන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 9. | එච්.කේ.ලක්රුවන් සම්පත් මහතා | ගරු මන්ත්‍රී |
| 10. | එන්.ජී. ගයාන් මධුෂංඛ මහතා | ගරු මන්ත්‍රී |
| 11. | ධර්මසිරි ගනේවත්ත මහතා | ගරු මන්ත්‍රී |
| 12. | පියල් හිරිමුතුගොඩ මහතා | ගරු මන්ත්‍රී |
| 13. | සුභාෂි මධුමාලි ඒකනායක මෙනවිය | ගරු මන්ත්‍රිනී |
| 14. | එඩේරආරච්චි වෙරංග ලක්මාල් මහතා | ගරු මන්ත්‍රී |
| 15. | නාපෙ විතානගේ සමන් මහතා | ගරු මන්ත්‍රී |
| 16. | සී. වනිගරත්න මහතා | ගරු මන්ත්‍රී |
| 17. | විලේගේ අමර ධනංජය මහතා | ගරු මන්ත්‍රී |
| 18. | ප්‍රියන්තා ගුණසේකර මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 19. | එම්.එම්.දිසානායක මහතා | ගරු මන්ත්‍රී |
| 20. | එන්.ඩබ්. පතිනායක මහතා | ගරු මන්ත්‍රී |
| 21. | විජිත් වීරගුණරත්න සහබන්දු මහතා | ගරු මන්ත්‍රී |
| 22. | කේ.කේ.අයි.නෙරංජලී මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 23. | කේ.ඒ.සී. දිල්රුක්ෂි මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 24. | එච්.එච්. ගයන්ති කුමාරි මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 25. | ඩබ්. කේ. නෙලී මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 26. | පී.ජී. රංජිත් ජයවීර මහතා | ගරු මන්ත්‍රී |
| 27. | ප්‍රියංගිකා දිල්රුක්ෂි ඒකනායක | ගරු මන්ත්‍රිනී |

### 01. ආගම සිහි කිරීම

2022.08.09 දින මහා සභාව ආරම්භ කිරීමට පළමුව පැමිණ සිටි සියලු දෙනා තම තමන්ගේ ආගම සිහි කිරීමෙන් අනතුරුව මිය ගිය ඥාතීන් රණවිරුවන් සිහිපත් කර විනාඩියක නිශ්ශබ්දතාවයක් පළ කළේය.

**02. මූලාසනයේ පිළිගැනීමේ කතාව**

මෙම අවස්ථාවට සහභාගි වී සිටින සියලුම මන්ත්‍රී මණ්ඩලය ඉතාම ගෞරවපූර්වකව පිළිගනු ලබනවා. රටේ වර්තමාන තත්ත්වය පිළිබඳව ඔබ අප කවුරුත් දන්නවා. අපි කැමති හොඳ නිර්මාණශීලී, අපි කාටත් ජීවත් වීමේ අයිතිය තහවුරු කරන, රටක් විදිහට,ජීවත්වීමට. ඒ අනුව ප්‍රාදේශීය සභාවේ සියලුම පරිපාලන කටයුතු නීතිමය ක්‍රමවේදයට පවත්වාගෙන යාමට කටයුතු කරනු ලබනවා. ඒ අනුව නැවතත් අද දින සපැමිණි උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලය මම ඉතා ගෞරවයෙන් යුක්තව පිළිගනු ලබනවා.

**ගරු මන්ත්‍රිනී ඉනෝකා මහත්මිය හා ගරු මන්ත්‍රි පතිනායක මහතා පෙ.ව.9.50 ට පමණ සභා ගර්භයට පැමිණෙන ලදී.**

**(අ)01. 2022.07.12 දින පැවති මහ සභා වාර්තාවේ නිවැරදි කිරීම් ඇත්නම් ඒවා නිවැරදි කර වාර්තාව ස්ථිර කිරීම.**

**(අ)02. පසුගිය වාර්තාවේ සංශෝධන ඉදිරිපත් කිරීම**

ගරු මන්ත්‍රී ගයාන් මධුසංඛ මහතා විසින් ඔහුගේ වෙනත් කරුණු යටතේ, ප්‍රකාශ කරන ලද තම ප්‍රදේශයේ මත්පැන් උවදුර සම්බන්ධව සඳහන් කල නමුත් එය සභා වාර්තාවේ සඳහන් වී නොතිබූ බවට ප්‍රකාශ කරන ලදී.

ඒ අනුව ඉහත සංශෝධනයන්ට යටත්ව 2022.07.12 දින පැවති මහා සභාවේ සභා වාර්තාව සභාව පිළිගතයුතු සත්‍ය වාර්තාවක් ලෙස ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් යෝජනා කළ අතර, ගරු මන්ත්‍රි පියල් හිරිමුතුගොඩ මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.

**(ආ). සභාපතිතුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන**

**නැත.**

**(ඇ). සන්දේශ පෙත්සම් පැමිණිලි ඉදිරිපත් කිරීම**

නැත.

**(ඇ). යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න**

නැත.

**ගරු මන්ත්‍රි නන්දන මහතා, ගරු මන්ත්‍රිනී නෙලී වක්වැල්ල මහත්මිය, ගරු මන්ත්‍රි චන්ද්‍ර සහබන්දු මහතා, ගරු මන්ත්‍රිනී ගයන්ති කුමාරි මහත්මිය පෙ.ව.10.00 ට පමණ සභා ගර්භයට පැමිණෙන ලදී.**

**(ඉ). (1) යථා පරිදි කල් දී ඇති යෝජනා**

01. නාගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අනාරක්ෂිත අඳුරු ස්ථානවල (ජනතාව නිතර ගැවසෙන) නව වීජී පහන් සවි කිරීම සඳහා අලුතින් වීජී පහන් කට්ටල 150 ක් මිළදී ගැනීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

02. කාලීන අවශ්‍යතා අනුව සභා බල ප්‍රදේශයේ මේ වන විට වෙන් කර ඇති සුසානභූමි හඳුනාගෙන නිසි ක්‍රමවේදයක් අනුව මැණුම් කටයුතු සිදු කර ඉදිරි කටයුතු කිරීමට යෝජනා කරමි.

උදා :- උඩුගම සතිපොළ පිටුපස ඇති සුසානභූමිය සඳහා වෙන් කර ඇති භූමිය නඩත්තු කොට භූමදාන කටයුතු සිදු කිරීමට යෝජනා කරමි.

(මේ වන විට නිසි ක්‍රමවේදයක් නොමැතිව දේහයන් භූමදාන කටයුතු සිදු කරනු ලබයි.)

ඒ සම්බන්ධයෙන් කමිටුවක් පත් කර ගෙන ඉදිරි කටයුතු කිරීමට තීරණය විය.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සදහන් යෝජනාව ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

03. නාගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පාපැදිලාභීන්ගේ පාපැදි බලපත්‍ර ගාස්තු යාවත්කාලීන කිරීමට යෝජනා කරමි. (දැනට පවතින ගාස්තුව රු. 4.00 කි. මෙය ගම් සභා කාලයේ සිට ක්‍රියාත්මක ගාස්තුවකි.)

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සදහන් යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් මධුසංඛ මහතා විසින් ස්ථිර කරන ලදී.**

**උප සභාපතිතුමා අදහස් දක්වමින්,**

ගැසට් එකේ තියෙන දෙයක් වෙනස් කරන්න බැරිවෙයි. ඒ දේ අපට අතුරු ව්‍යවස්ථාවකින් තමයි කරගන්න වෙන්නෙ.

**ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා අදහස් දක්වමින්,**

මම දන්නා පරිදි ගැසට් එකේ තිබෙන පාපැදි ගාස්තු සහා සම්මුතියකින් අපට වෙනස් කරන්න බැහැ.

**ගරු සභාපතිතුමා අදහස් දක්වමින් ප්‍රකාශ කර සිටියේ**, ඒ සම්බන්ධව කටයුතු කරන ඉහළ නිලධාරීන්ගෙන් උපදෙස් ලබාගෙන කටයුතු කිරීම සුදුසු බවයි.

**මේ සම්බන්ධයෙන් සිදු කරනු ලබන ක්‍රමවේදය පිළිබඳ උපදෙස් ලබාගෙන ඉදිරි කටයුතු කිරීමට තීරණය වූ බැවින්, එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.**

**ගරු මන්ත්‍රී බන්දුල මහතා, ගරු මන්ත්‍රී වනිගරත්න මහතා, පෙ.ව.11.00 ට පමණ සභා ගර්භයට පැමිණෙන ලදී.**

04. වළකුඹුර ඉදිකරන ආදාහනාගාර ගොඩනැගිල්ලේ ඉතිරි වැඩ නිම කිරීමට අදාළව දේශීය ණය සංවර්ධන අරමුදලින් ණය ලබා ගැනීම සඳහා සකස් කරන ලද රු.32,280,329.81 ක ඇස්තමේන්තුව හා ව්‍යාපෘති වාර්තාව සහා අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සදහන් යෝජනාව ගරු මන්ත්‍රී නිශාන්ත නන්දන මහතා විසින් ස්ථිර කරන ලදී.**

**උප සභාපතිතුමා අදහස් දක්වමින්,**

තව ටිකක් සොයා බලා ආණ්ඩුවෙ මධ්‍ය රජයෙන්ම මෙම මුදල් ගන්න බලන්න.

**ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා අදහස් දක්වමින්,**

ගිය සභාවෙත් මේ සම්බන්ධව කරුණු ඉදිරිපත් කළා. නන්දන මන්ත්‍රීතුමා කිව්වා ණයක් හරි අරගෙන කලාට පාඩු නැහැ කියලා. රුපියලේ අගය අවප්‍රමාණය වීමත් එක්ක අපි යම් එකඟතාවයකට ආවා. නමුත් ඒ සල්ලි ටික පළාත් පාලනයෙන් ගන්න ඕන. මොකද මේ ණය වාරිකය අපේ සභාවට දරන්න බැරිවෙනවා. දේශීය ණය දෙපාර්තමේන්තුවට ගිහිල්ලා ණය අනුමත වෙලා එනකොට යම් කාලයක් යාමත් සමඟ එම අනුමත කර ගන්න මුදලට ඒ දේ කරගන්න බැරිවෙනවා. ඒ පිළිබඳව අපි ප්‍රායෝගිකව තේරුම් ගන්න ඕන.

ඊළඟට ආදාහනාගාර පාර සෑදීමේදී ඒ සඳහා අමතර වියදමක් දරන්න ඕන. සභාවේ පරිපාලන කටයුතුවලට වියදම් කරන්න ඕන. ලොකු අර්බුධකාරී තත්වයකට සභා යන බව තමයි මේ කාරනාවෙන් පෙනෙන්නෙ. අපි දේශපාලනික වශයෙන් ගත් තීන්දුව අනුව මේක අනුමත කරලා තියන එක වැරදි නැහැ. නමුත් ආණ්ඩුව නැවත ස්ථාවර වෙමින් යන මේ මොහොතෙ අපි අඩු ආදායම්ලාභී සභාවක් ලෙස පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් අපි අමාරුවෙ දැමීමක් වෙන්නෙ. සභාපතිතුමා, ඔබතුමා වේලාවක් ඉල්ලගන්න. මේ සම්බන්ධව අගමැති ලේකම්තුමා සමඟ හරි අපි සාකච්ඡාවකට යමු.

**ගරු මන්ත්‍රී නිශාන්ත නන්දන මහතා**

ණය ගන්න පුළුවන් වෙන්නත් ඕන. ණය ගෙවන්න පුළුවන් වෙන්නත් ඕන. ණය ලබා ගත නොහැකිනම්, සභාවල වැඩක් කරන්න බැරිවේවි.

ගරු සභාපතිතුමා විසින් ඉහත සඳහන් යෝජනාව සම්බන්ධයෙන් එකඟතාවය විමසන ලදී.

**ඉහත සඳහන් යෝජනාව සම්බන්ධයෙන් විරෝධතා කිසිවක් නොමැති හෙයින් ඒකමතිකව සභා සම්මත විය.**

**ගරු මන්ත්‍රී වෙරංග මහතා, ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා, ගරු මන්ත්‍රී අමර ධනංජය මහතා, ගරු මන්ත්‍රී සමන් මහතා, ගරු මන්ත්‍රී ධර්මසිරි මහතා, ගරු මන්ත්‍රී තරංග මහතා පෙ.ව.11.15 ට පමණ සභා ගර්භයට පැමිණෙන ලදී.**

**05. ඉදිරි ගෙවීම් වාර්තාව ඉදිරිපත් කිරීම**

<u>**2022.0**8.09 වන දින පවත්වනු ලබන මහසභා රැස්වීම සඳහා ඉදිරිපත් කළ යුතු ඉදිරි ගෙවීම් වාර්තාව</u>

**01. සභාපති, නාගොඩ ප්‍රාදේශීය සභාව, නාගොඩ**

I. 2022 ජුලි මස මන්ත්‍රීවරුන් සඳහා ඉන්ධන ලබා ගැනීමේ බිල්පත **- රු.81,000.00**

**02. චන්දිමා සෙනෙවිරත්න මිය, ලේකම්, නාගොඩ ප්‍රාදේශීය සභාව** **- රු.48,114.46**

රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක **sp/psc/07/01/08(37)** හා 2022.02.07 දිනැති ලිපිය අනුව ලේකම් තනතුරෙහි වැඩ බැලීම වෙනුවෙන් දීමනා ගෙවීම 2022.02.22 සිට 2022.07.31 දක්වා

**03. විගණකාධිපති, ජාතික විගණන කාර්යාලය, අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල රු.118,200.00**

2021 වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන විගණනය කිරීම වෙනුවෙන් අදාළ විගණන ගාස්තු

**04. දේශීය ආදායම් කොමසාරිස්. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, මුද්දර බදු අංශය, කොළඹ 02** **-රු.10,440.00**

මුද්දර බදු මුදල් පියවීම (2021/04/01- 2021/06/30 දක්වා ව්‍යාපාර බලපත්‍ර ගාස්තු සඳහා මුද්දර බදු ලැබීම් - රු. 5,915.00

2021/04/01 – 2021/06/30 දක්වා කාර්තුවට වැටුප් වලින් අය කර ගත් මුද්දර බදු දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේශනය කිරීම - රු. 4,525.00

**05. එල්. එස්. ආර්. විජේතිලක, නාගොඩ, ගාල්ල** **- රු. 6,000.00**

නාගොඩ කැකුලු පෙර පාසල පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ල සඳහා 2022 අගෝස්තු මස බදු කුලිය ගෙවීම

**06. එම්.ජේ. ජනිත් ඉරේෂ්, කුමාර, ජාගොඩ කේක් ඇන්ඩ් ස්වීට්ස්, ඉහළ ලේලවල,**
**ගා/ වදුරඹ** **- රු.11,485.00**
2022.07.12 දින පැවති මහ සභා වාරය සඳහා සංග්‍රහ වියදම් බිල්පත පියවීම

**07. ජී.එල්. ලක්මාලි, සාරංග ෆුඩ් සිටි, ඇතුමලේ, මාපලගම** **-රු.4,310.00**
2022.07.12 දින පැවති මහා සභා වාරය සඳහා වතුර බෝතල් මිලදී ගැනිමේ බිල්පත පියවීම

**08. රංජිත් මානෙල්, හොටෙල් සීගිරි, මාපලගම පාර,නාගොඩ** **-රු. 825.00**
ආයුර්වේද සායනයේ සංග්‍රහ වියදම් පියවීම

**09. ඒ.කේ නිලන්ති සජීවනී, ග්‍රාෆ්ටෙල් කොමියුනිකේෂන්, යටලමත්ත.**
2022 ජූලි මස සභා වාර්තා පිටපත් 28ක් මුද්‍රණය කිරීම වෙනුවෙන් බිල්පත් පියවීම **-රු.5,054.00**
2022 ජූලි මස මහජන නියෝජිතයන් සඳහා දුරකථන කාඩ්පත් ලබා ගැනීමේ බිල්පත -රු.28,500.00

**10. ඒ.ඩී. කරුණාරත්න, සරත් ස්ටෝර්ස්, යටලමත්ත** -රු. 8,450.00
2022 ජූලි මාසය සඳහා නාගොඩ පුස්තකාලයට පුවත්පත් මිලදී ගැනීමේ බිල්පත පියවීම

**11. එච්. එල්. කේ. ශ්‍රීනිත් රුක්ෂාන්, සමගිගම, උඩුගම දකුණ, ගා/උඩුගම** -රු. 7,050.00
2022 ජූලි මාසය තුළ දී උඩුගම මහජන පුස්තකාලයට පුවත්පත් සැපයීම
වෙනුවෙන් බිල්පත් පියවීම

**12. නානයක්කාර හාඩ්වෙයාර්, නාගොඩ, ගාල්ල** -රු. 880.00
ප්‍රධාන කාර්යාලයේ වතුර මෝටරයේ අලුත්වැඩියා කිරීමට අවශ්‍ය උපාංග ලබා ගැනීමේ
බිල්පත පියවීම

**13. දයානි ට්‍රේඩ් සෙන්ටර්, මාපලගම** - රු. 3.200.00
ප්‍රධාන කාර්යාලයේ ලිඳේ බැම්ම බැඳීම සඳහා අවශ්‍ය සිමෙන්ති කොට්ට 01 ක්
ලබා ගැනීමේ බිල්පත ගෙවීම

**14. චාමින් හාඩ්වෙයාර්, නව නගරය,තල්ගස්වල** - රු. 2205.00
තල්ගස්වල සති පොළ භූමියේ ජලනල පද්ධතියේ අළුත්වැඩියා කටයුතු සිදු කිරීම

**15. අබේනායක ඔටෝ සර්විස්, වක්වැල්ල පාර, ගාල්ල** - රු.60,447.50
252-6478 කැබ් රථය සේවා කිරීමේ බිල්පත පියවීම

**16. කේ.ටී.ආර්.ජී. උමාල් කිරිඇල්ල මයා, ග්‍රෑන්ඩ් මෝටර්ස්, වදුරඹ** - රු. 17,750.00
**SPPF** 7360 අංක දරණ කැබ් රථයේ ඉදිරිපස බ්‍රේක් ප්ලෑඩ් සෙට් එක දැමීමේ
බිල්පත පියවීම

**17. ඩිබග් කම්පියුටර් පෙරිපර්ල්ස්, ප්‍රයිවට් ලිමිටඩ්, කොළඹ** -රු. 18,144.00
**Epson LQ 2090, Jolimark DP 350, HP Leserjet 1536** ප්‍රින්ටර් සේවා කිරීමේ
වාර්ශික ගිවිසුම සඳහා ගෙවීම

**18. යශෝධරා රශිනි නාගොඩවිතාන මිය, ආනන්දගිරි, නාගොඩ , ගාල්ල**
සභාපතිතුමාගේ මහජන සම්බන්ධතා නිලධාරී දීමනාව ගෙවීම - 2022 ජූලි - රු. 14500.00

**19. <u>සේවක ණය</u>**
පාපැදි ලබා ගැනීම සඳහා ණය මුදල

| | | | |
|---|---|---|---|
| I. | ජී.එල්.උපුල් ධර්මසිරි | - වැඩ ක්ෂේත්‍ර කම්කරු | - රු. 6,000.00 |

| | | | |
|---|---|---|---|
| **II.** | කේ.පී.ජී. ප්‍රසන්න | - වැඩ ක්ෂේත්‍ර කම්කරු | - රු.6,000.00 |
| **III.** | ඒ.එච්.ජී. සංජීව ගුණවර්ධන | - වැඩ ක්ෂේත්‍ර කම්කරු | - රු. 6,000.00 |

**20. <u>2022 ජූලි මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම (ක්ෂේත්‍ර නිලධාරින් සඳහා)</u>**

| | | | |
|---|---|---|---|
| **I.** | කේ.ඩී.එස්.නිපුනිකා මිය | - සංවර්ධන නිලධාරී | -රු.5,900.00 |
| **II.** | ඩබ්.ජේ.ඒ. ශානක මයා | - ආදායම් පරීක්ෂක | -රු.4,000.00 |

**21.** <u>ආයතනයේ රාජකාරි ගමන්වල නියලීම වෙනුවෙන්</u>

<u>2022 මැයි මස ගමන් වියදම්</u>

| | | | |
|---|---|---|---|
| **I.** | අනුර දිසානායක මයා | - රියදුරු | - රු. 860.00 |

<u>2022 ජුනි මස ගමන් වියදම්</u>

| | | | |
|---|---|---|---|
| **I.** | අනුර දිසානායක මයා | - රියදුරු | - රු.1.050.00 |

<u>2022 ජූලි මස ගමන් වියදම්</u>

| | | | |
|---|---|---|---|
| **I.** | එම්.ඒ.වසන්ත මයා | - රියදුරු | - රු2,100.00 |

**22.** <u>අතිකාල දීමනා ගෙවීම්</u>

<u>2022 ජුනි මස</u>

| | | | |
|---|---|---|---|
| **I.** | අනුර දිසානායක මයා | - රියදුරු | -රු.2,451.00 |
| **II.** | ඒ.එච්.ජී. සංජීව මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු | - රු.3,171.00 |

**<u>2022 ජූලි මස</u>**

| | | | |
|---|---|---|---|
| **I.** | එම්.ඒ.වසන්ත මයා | - රියදුරු | - රු. 6,573.00 |
| **II.** | අනුර දිසානායක මයා | - රියදුරු | - රු. 3,363.00 |
| III. | කේ. එච්.එම් නිශාන්ත ඉඳුනිල් | - රියදුරු | - රු. 7,062.00 |
| **IV.** | ඩී.ටී.ආර්.ඒ. ගුණරත්න මයා | - මුරකරු | - රු. 4,173.00 |
| **V.** | යසරත්න විජේසේකර මයා | - මුරකරු | - රු. 8,540.00 |
| **VI.** | ඩබ්.කේ. සම්පත් සංජීව මයා | - අනියම් රියදුරු | - රු. 5,992.00 |
| **VII.** | එන්.එම්.රජිත් මයා | - අනියම් මුරකරු | - රු. 3,838.00 |
| **VIII.** | ඒ.එච්.ජී. සංජීව මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු | - රු. 1,750.00 |
| **IX.** | කේ.ජී.හර්ෂ චාමර සම්පත් මයා | - සෞඛ්‍ය කම්කරු | - රු. 1,515.00 |
| **X.** | එම්.ඩබ්ලිව්.හර්ෂ කුමාර මයා | - සෞඛ්‍ය කම්කරු | - රු. 6,099.00 |
| **XI.** | ඩබ්. ජී. දයානන්ද | - සෞඛ්‍ය කම්කරු | - රු. 2,624.00 |

**ඒ අනුව ඉදිරි ගෙවීම් වාර්තාවේ සඳහන් අංක 1 – 22 දක්වා ඇති ඉදිරි ගෙවීම් සහා අරමුදල් මගින් ගෙවීම සුදුසු බව ගරු සභාපතිතුමන් කල යෝජනාව ගරු මන්ත්‍රී අජිත් එඬේරආරච්චි මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**2022.08.09 දින නාගොඩ ප්‍රාදේශීය සභා මහා සභා රැස්වීම සඳහා ඉදිරිපත් කරනු ලබන ආවරණ අනුමැතිය යටතේ සිදු කරන ලද ගෙවීම් වාර්තාව**

01. **මහජන බැංකුවේ ලංකා විදුලිබල මණ්ඩල ගිණුම , විදුලි බිල්පත් පියවීම**

| | | | | |
|---|---|---|---|---|
| i. | 8616374000 | - උඩුගම ටොයිලට් කම්ප්ලෙක්ස් | -(අප්‍රේල් 2022) | - රු. 240.00 |
| | | | -(මැයි 2022) | - රු. 368.10 |
| ii. | 8622062600 | - ආදාහනාගාරය | - ( ජුනි- 2022) | - රු. 699.60 |

02. **සභාපති, නාගොඩ ප්‍රාදේශීය සභාව**

i. සභාව සතු අත්‍යවශ්‍ය සේවා වෙනුවෙන් යොදවනු ලබන වාහන සඳහා ඉන්ධන ඩීසල් ලීටර් 50 ක් ලබාගැනීම වෙනුවෙන් අත්තිකාරම් ලබා ගැනීම -රු.22000.00

ii. SPRA 8570 ට්‍රැක්ටරය, SPRX 2239සුදු යකඩ බවුසරය රක්ෂණය සඳහා අත්තිකාරම් ලබා ගැනීම - රු. 1600.00

03. **රණසිංහ ආරච්චිගේ කරුණාරත්න, කුරුන්ද, ගා/ උඩුගම**

මාර්ග පළුදු කර ජලනල එළීම වෙනුවෙන් තැන්පත් කල මුදල ආපසු ගෙවීම -රු. 1000.00

04. **ඒ.කේ.නිලන්ති සජීවනී,ග්‍රාෆ් ටෙල් කමියුනිකේෂන්**

2022.07.12 දින සභාවාරය සඳහා පැමිණි මහජන නියෝජිතයන් වෙනුවෙන් දුරකථන කාඩ්පත් ලබා දීමේ බිල්පත් පියවීම (2022 ජුනි මස) - රු.28500.00

05. **මහජන බැංකුවේ ලංකා විදුලිබල මණ්ඩල ගිණුම විදුලි බිල්පත් පියවීම**

| | | |
|---|---|---|
| 450908908 | - උක්ඕවිට පෙර පාසල (2022 ජූලි) | - රු. 1140.90 |
| 4591713210 | - ප්‍රධාන කාර්යාලය (2022 ජූලි) | - රු.3277.80 |
| 2813189405 | - තල්ගස්වල පෙර පාසල (2022 ජුනි) | - රු. 276.60 |
| 4509082800 | - උදාර පෙර පාසල (2022 ජූලි) | - රු. 240.00 |
| 2810125104 | - දීප්ති පෙර පාසල (2022 ජුනි) | - රු. 276.60 |
| 2813038709 | - කැකුළු පෙර පාසල(2022 ජුනි) | - රු. 240.00 |
| 861914704 | - රන්කැකුළු පෙර පාසල(2022 ජුනි) | - රු. 498.30 |
| 4507357802 | - සමනළ පෙර පාසල(2022 ජුනි) | - රු. 276.60 |
| 4591713210 | - ප්‍රධාන කාර්යාලය(2022 ජුනි) | - රු.4558.80 |
| 8616373802 | - උඩුගම පොළ හෝමදොළ(2022 ජුනි) | - රු. 240.00 |
| 8616374000 | - උඩුගම ටොයිලට් කම්ප්ලෙක්ස් (2022 ජුනි) | - රු. 276.60 |
| 8617046104 | - උඩුගම බහුකාර්ය මධ්‍යස්ථානය(2022 ජුනි) | - රු. 551.10 |
| | (2022 ජූලි) | - රු. 532.80 |
| 4594192319 | - උඩුගම උප කාර්යාලය (2022 ජුනි) | - රු. 642.60 |
| | (2022ජූලි) | - රු. 752.40 |

**02. 2022 ජූනි මස දුරකථන බිල්පත් පියවීම**

**ශ්‍රී ලංකා ටෙලිකොම් පී එල් සී**

| | | | |
|---|---|---|---|
| i. | 0912296577 | - මාපලගම උප කාර්යාලය | - රු. 453.44 |
| ii. | 0912296537 | - සභාපතිතුමාගේ නිල කාමරය | - රු. 3294.31 |
| iii. | 0912296433 | - ප්‍රධාන කාර්යාලය (2022 මැයි) | - රු. 2823.92 |
| | | (2022 ජුනි) | - රු. 3173.02 |

**03. සී/ස ලංකාබෙල් සමාගම**

0915701722 - උප සභාපතිතුමාගේ නිවසේ දුරකථන බිල්පත පියවීම (2022 ජුනි) - රු. 657.15

**04.ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය - ජල බිල්පත් පියවීම**

33/53/003/009/10 - උඩුගම බහුකාර්ය මධ්‍යස්ථානය- 2022 ජූලි මස - රු. 3976.86
33/53/001/069/11 - උඩුගම පොළ- 2022 ජූලි මස - රු. 1047.46

**ආවරණ අනුමැතිය යටතේ කල ගෙවීම් සහා අරමුදල් මගින් දැරීම සුදුසු බව ගරු සභාපතිතුමන් කල යෝජනාව ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

**(ඉ) 2. රැස්වීම් රීති 11(8) යටතේ ඉදිරිපත් කරන යෝජනා.**

06. ග්‍රාමීය මාර්ගවල කළුගල්, පස් ප්‍රවාහනය කිරීමේදී සභාව සතු මාර්ගවලට, පාලම්වලට, බෝක්කුවලට හානි සිදුවන බැවින්, ඒවායේ නඩත්තුව සඳහා මුදලක් අය කර ගැනීමට යෝජනා කරමි.

ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ස්ථිර කරන ලදී.

**මෙහිදී ගල්, පස්, වැලි ටිපර් රථ 01 ක් සඳහා රු. 250.00 ක මුදලක් අය කිරීම සුදුසු බව ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

07. ආදාහනාගාර මාර්ගයේ සෝදා ආ පස් ඉවත්කිරීමට ජේ.සී.බී. යන්ත්‍රය යොදා ගැනීම වෙනුවෙන් වානක එන්ටර්ප්‍රයිසස් වෙත ගෙවිය යුතු රු. 24000.00 ක මුදල සඳහා අනුමැතිය ලබා දීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

08. නාගොඩ ප්‍රාදේශීය සභාව මගින් පාලනය වන කටඹුරාව ළඟිරු පෙර පාසලේ ප්‍රධාන පාලිකාව වන කේ.ටී.එම්.රංගනී ප්‍රදීපා මහත්මියට හා උඩුගම නැගෙනහිර රන්කැකුළු පෙර පාසලේ ප්‍රධාන පාලිකාව වන කේ.සංජීවනී තිළිණි කුමාරි මහත්මියට අගෝස්තු මාසයට අදාළව කොන්ත්‍රාත් පදනමින් වැටුප් ගෙවීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

09. 2022 වර්ෂයේ සැප්තැම්බර් මස සාහිත්‍ය මාසයට අදාළව නාගොඩ, මාපලගම හා උඩුගම මහජන පුස්තකාල 3ට අදාළව අයවැයෙන් වෙන් කර ඇති රු. 350,000.00 ක මුදලින් පොත් ලබා ගැණීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

10. අනතුරුදායක ගස් ඉවත් කිරීමේ ක්‍රමවේදයේදී අධිකරණයේ නඩු පවතින ඉඩම්වල ඇති ගස් ඉවත් කිරීමේදී අනතුරුදායක ගස් වෙන්දේසි කර උසාවිය වෙත මුදල් ගෙවිය යුතු වේ. එහිදී සභාව විසින් අමතර වියදමක් දැරීමට සිදුවන බැවින්, පරිපාලන වියදම් ලෙස වෙන්දේසි

කරනු ලබන ගස්වල වටිනාකමින් 15% ක මුදලක් සභාව වෙත අය කර ගෙන, ඉතිරි මුදල් අධිකරණය වෙත ගෙවීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සදහන් යෝජනාව ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**(ඉ) 03.ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම**

I. යෝජිත වළකුඹුර ආදාහනාගාරයේ පිවිසුම් මාර්ගය හා භූමිය සකස් කිරීම
අදියර IV - රු.500,000.00

II. ඇප්තොප්වත්ත PC 30 එක්ස්කැවේටර් යන්ත්‍රයක් යොදා
සංවර්ධනය කිරීම -රු. 60,000.00

**මෙම ඇස්තමේන්තුව ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා භාරගෙන මිනිස් ශ්‍රමයෙන් කිරීමට එකග විය.**

III. Canon LBP 6030 ප්‍රින්ටරයේ අලුත්වැඩියාව සඳහා අදාල
ඇස්තමේන්තු 02 - රු. 5,600.00
රු.29,850.00

IV. අකුණු සැර වැදීම නිසා අලුත්වැඩියාවට යොමුකර ඇති ඊ්විස් පරිගණකයට
අදාළ ඇස්තමේන්තුව - රු.42,315.00

**ඉහත සදහන් ඇස්තමේන්තු සභාව පිළිගත යුතු බවට ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රිනී නෙලී වක්වැල්ල මහත්මිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

V. කථන උපකරණ 24 සහිත TKOKO MC 500 කථන පද්ධතිය, ඇම්ප්ලිෆයරය සහ එයට සම්බන්ධිත රැහැන් සහ උපකරණ සියල්ල, සඳහා සේවා සැපයීම, දෝෂ හඳුනා ගැනීම, එම දෝෂ යථා තත්වයට පත් කිරීම සහ පද්ධතිය ක්‍රියාත්මක කිරීම පිළිබඳව පුහුණුව සහ උපදෙස් ලබා දීම ඇතුළුව වැය ඇස්තමේන්තුව රු. 37000.00

දෝෂ යථා තත්වයට පත් කල නොහැකි උපකරණ, උපාංග සහ රැහැන් සඳහා නව උපකරණ උපාංග සහ රැහැන් සැපයීමට සිදු වන්නේ නම්, ඒ සඳහා පහත සඳහන් ලෙස සහනදායි අය කිරීමක් මගින් නව උපකරණ උපාංගයන් රැහැන් සැපයීම සිදු කල හැක.

- TKOKO MC 500 Conference System - රු.64000.00
- TKOKO MC 501 Chairman Unit - රු.32000.00
- TKOKO MC 502 Deligate Unit - රු.30000.00
- TKOKO MC 10w Speaker - රු.14000.00
- 5mt Conference Cable - රු.10000.00
- 10mh Conference Cable - රු.18000.00
- Speaker Cable 1mt - රු. 150.00

**ඉහත සඳහන් ඇස්තමේන්තුව උපකරණ ක්‍රියා විරහිත අවස්ථාවලදී පමණක් සාදවා ගෙවීම් කිරීමට තීරණය වු අතර, එසේ ගෙවීම් කිරීමට ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රිනී නෙලී වක්වැල්ල මහත්මිය විසින් ස්ථිර කරනු ලදුව, ඒකමතිකව සභා සම්මත විය.**

ඉ(04.)මිළ ගණන් ඉදිරිපත් කිරීම

**නාගොඩ ප්‍රා දේශීය සභාවට අවශ්‍ය ලිපිද්‍රව්‍ය මිළදී ගැනීම සඳහා ලැබී ඇති මිළ ගණන්**

| විස්තරය | දූලාර ස්ටේෂනරීස්, ගාල්ල | ඒ.ජේ.ජී.ස්ටේෂනරීස්, ගාල්ල | රෙනුල ස්ටේෂනරීස්, ගාල්ල රු. |
|---|---|---|---|
| A4 80g ෆොටෝ කොපි පැකට් 01 | 2950.00 | 2600.00 | 2975.00 |
| පොලිතීන් මීටර් 01 ක් | 65.00 | 40.00 | 75.00 |
| 9x4 ප්‍රමාණයේ ලියුම් කවර | 765.00 | 500.00 | 595.00 |
| 9 1/2 x4 1/2 ප්‍රමාණයේ ලියුම් කවර | 890.00 | 600.00 | 725.00 |
| ඇට්ලස් චූටි පෑන් 01 | 29.00 | 25.90 | 30.00 |
| හාෆ් ෂීට් පැකට් 01 ක් | 1780.00 | 1450.00 | 1810.00 |

**නාගොඩ ප්‍රා දේශීය සභාවට අවශ්‍ය ලිපිද්‍රව්‍ය මිළදී ගැනීම සඳහා ලැබී ඇති මිළ ගණන් අනුව අවම මිළ ගණන් ඉදිරිපත් කල ඒ.ජේ.ජී.ස්ටේෂනරීස්, ගාල්ල වෙතින් නාගොඩ ප්‍රාදේශීය සභාවට අවශ්‍ය ලිපිද්‍රව්‍ය මිළදී ගැනීම සුදුසු බව ගරු මන්ත්‍රී සුභාෂි ඒකනායක මෙනවිය විසින් යෝජනා කරනු ලදුව, ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**(ඊ) කාරක සභා වාර්තා**

01.2022.07.01 දින පැවති ප්‍රසම්පාදන කමිටු වාර්තාව

**(උ). ලැබීම් හා ගෙවීම් වාර්තා**

නැත.

**(ඌ) වෙනත් කරුණු**

**ගරු මන්ත්‍රී වසන්ත කුමාරගේ මහතා**

ගරු සභාපතිතුමා ඇතුළු සමස්ත සභාවෙන් අවසරයි. පළමුවෙන්ම අද දවසේ ගෞරවනීය ප්‍රණාමය පුද කරන්න ඕන රනිල් වික්‍රමසිංහ ගරු ජනාධිපතිතුමාට, ඒවගේම හදවතින්ම උණුසුම් සුභාසිංශන පුද කරසිටිනවා. රාජපක්ෂවරු විසින් දරුණුම ප්‍රපාතයකට ඇද දමා තිබුණු, කාබාසිනියා කරලා තිබුණු රට යම් තත්ත්වයකට ගොඩනැගෙමින් පවතිනවා.ඒවගේම තමයි ජනතාවගේ ප්‍රශ්න කෙමෙන් කෙමෙන් අඩු වෙමින් පවතිනවා. ප්‍රාදේශීය වශයෙන්, ජාත්‍යන්තර වශයෙන්, රට ප්‍රපාතයකට ඇද දමා තිබුණු වෙලාවක, රට කෙමෙන්, කෙමෙන් යහපත් අතට හැරෙමින් පවතිනවා. අවුරුදු විසි හතක් පමණ කාලයක් එක්සත් ජාතික පක්ෂය, අපි රනිල් වික්‍රමසිංහ මැතිතුමා ඔය තැනට ගෙන යාමට උත්සාහ දැරුවත්, රාජපක්ෂවරු ඒ අවස්ථාව නැති කලා. නමුත් දැන් රාජපක්ෂවරුන්ම එම අවස්ථාව රනිල් වික්‍රමසිංහ මැතිතුමාට ලබා දීලා තියෙනවා. ඔහු දක්ෂ වැඩකාරයෙක්. යමක් කරන්න පුළුවන් පුද්ගලයෙක්. ඒ බව දැන් පෙන්නලා තියෙන්නේ. ඒ වුනාට ප්‍රශ්නය තියෙන්නේ, රාජපක්ෂවරු හදපු ආණ්ඩුව යටතේ තමයි රනිල් වික්‍රමසිංහ මැතිතුමාට නායකත්වය දරන්න වෙලා තියෙන්නේ. නැත්නම් ඊට වඩා යමක් ලබාගන්න තිබුණා. යමක් ලබාගන්න සහයෝගය වත් ගන්න බැරි වෙලා තියෙන්නේ. ඒ නිසා තමයි පාර්ලිමේන්තු මැතිවරණයකට ගිහිල්ලා, පාර්ලිමේන්තුවේ වෙනසක් කරවන්න තමයි උත්සාහ කරන්නේ. ඒ

සඳහා අපි සියලු දෙනාම සහයෝගය දෙනවා. සමගි ජන බලවේගය හැටියට සහාය දෙනවා. මේ රටේ අඳුරු යුගය නැති කරන්න ශක්තිය, ධෛර්යය ලැබේවායි ප්‍රාර්ථනා කරනවා.

ඒ වගේම මම මේ වෙලාවේ නාගොඩ ප්‍රාදේශීය සභාව පිළිබඳව ඉතාමත් කණගාටු වෙනවා. වත්මන් පාලන තන්ත්‍රය තුළ සිදුවෙමින් පවතින විවිධ ක්‍රියා නිසා, ජනතාවගේ අදහස් එක්ක මන්ත්‍රීවරුන් හැටියට කනගාටු වෙනවා. පසුගිය සුමානේ උඩුගම සති පොලේ යම් සිද්ධියක් වෙලා තියෙනවා. කොට්ඨාශ මන්ත්‍රීවරුන් මේ සභාවේ මේ මොහොතේ ඉන්නවා. පසුගිය 18 සඳුදා උඩුගම පොළේ යම් සිද්ධියක් වුණා. අපේ ආදායම් පරිපාලකතුමා පොළ භූමියේදී දැඩි පහර දීමකට ලක් වුණා. ඒ පිළිබඳව මම බලාපොරොත්තු වෙනවා, ගරු සභාපතිතුමනි, ඔබතුමා ගත්ත ක්‍රියාමාර්ගය මොකක්ද? මොකද ඒ පොලේ හිටපු වෙළඳුන් කිහිපදෙනෙක් මට වීඩියෝ මගිනුත් පෙන්නුවා. අපේ ආදායම් පරීක්ෂකතුමාට පහර දීලා, අතේ තිබ්බ්ච සල්ලි ටිකත් උදුර ගත්තා. වෙනදනම් ඔබතුමා මගේ කතාවලට මැදින් පැනල උත්තර දෙනවා. හවස තුනහමාරට, හතරට විතර මම හිතන්නේ. මේ පොලේදි එදා විතරක් වෙච්ච සිද්ධියකුත් නෙවෙයි. මීට ඉහතදීත් මේ කතන්දරය වෙනවා. දවල් 12 වන විට මේ සල්ලි එකතු කරලා, ඉන් කොටසක මත්පැන් පානය කරනවා. සමහර විට හවසත් ඒක කරනවා ඇති. ඒ කෙනාත් මත්පැන් බොනවා ඇති. යම් යම් ක්ෂේත්‍රවල, යම් යම් නිලධාරි පිරිසක් මේකට සම්බන්ධයක් තියෙනවා. එකතු කරන ගාන නෙවෙයි පොතට යන්නේ. ඊට වැඩිය සල්ලි එකතු වෙනවා. උදාහරණයක් ලෙස පොලේ මාළු වෙළඳුන් හතරක් ඉන්නවා. නමුත් එක්කෙනෙක් තමයි පොතේ සටහන් වෙන්නේ. මේක උඩුගම පොලට විතරක් නෙවෙයි. තල්ගස්වල පොළටත් අදාලයි. මෙය ජාවාරමක් වෙලා. මේක ඇත්තටම සභාවට ලැබෙන ආදායම් අහිමිවීමක්. ආදායම් පරිපාලකතුමා හරියට කටයුතු කරනවා නම්, ලොකු මුදලක් එකතු කරගන්න පුළුවන්. නාගොඩ ප්‍රාදේශීය සභා භාණ්ඩ ගබඩාවේ තිබුණු බයිසිකලේ අතුරුදහන් වෙලා තිබුණා. මම අහන්න කැමතියි, ගරු සභාපතිතුමා, මේ බයිසිකලේ නැති වෙන්න කලින් පිරිසක්, ඒක සුද්ද කරන්න ගිහිල්ලා තියෙනවා. ඒ පිරිස සභාවෙ පිරිසක් ද? නැත්නම් පිට පිරිසක් ද කියලා.

**ගරු සභාපතිතුමා පිළිතුරු දෙමින්**

සභාවේ පිරිසක්

**ගරු මන්ත්‍රී වසන්ත කුමාරගේ මහතා**

මෙහි ප්‍රශ්නාර්ථ ගැටලුවක් තියෙනවා. දීර්ඝ කාලයක් සභාව සතුව තිබුණු බයිසිකලය නැති වෙලා තියෙන්නෙ. සමහර විට සුද්ද කළ පිරිසට දොර වහලා යන්න අමතක වෙන්න ඇති. හරියට මොකද වුනේ කියලා දන්නේ නැහැ. මේ බයිසිකලේ නැතිවීම සහ උඩුගම සතිපොළේ දී ආදායම් පරිපාලක මහතාට පහර දීම සම්බන්ධව කුමන හෝ ක්‍රියාමාර්ගයක් ගත්තද?

**ගරු සභාපතිතුමා පිළිතුරු දෙමින්**

බයිසිකලය නැතිවීම සම්බන්ධව පොලිස් පැමිණිල්ලක් දාලා ඇති. ආදායම් පරික්ෂකතුමාට පහරදීම සම්බන්ධව,

**ගරු මන්ත්‍රී වසන්ත කුමාරගේ මහතා**

ඒ වගේම වීථි පහන් 150ක් මිලදී ගන්න යෝජනා වෙලා තියෙනවා. මම දැක්ක යෝජනාවක් දාලා තිබුණා. නමුත් සභාවේ තියෙන මූල්‍ය තත්ත්වයත් එක්ක ඒක නෙවෙයි විය යුත්තේ. ටෙලිකොම් එකට පහලින් ඇති කොස්ගහ පාරේ අබලන්ව ඇති ස්ථාන කොරි පස් ටිකක් දාලා අළුත්වැඩියා කරල දෙන්න කියලා ඉල්ලනවා. මොකද ඔබතුමාගේ කොට්ඨාසය. ඒ වගේම සභාව සතු පාරවල්වල යන්න දැන් බැරි තත්ත්වයක් උදාවෙලා තියෙන්නෙ. ඒ දේවල් තමයි සභාවෙන් කෙරෙන්න ඕන.

අවසාන වශයෙන් සභාවෙ තියෙන වාහනවලට ඉන්ධන ලබා දීමේදී අධීක්ෂණයක් කෙරෙනවද? මම හිතන්නේ මේ සභාව දැන් හොර ගුහාවක් වෙලා තියෙන්නෙ. මේකට තනිකර වගකියන්න ඕන සභාපතිතුමා. මොකද මේකෙ පරිපාලනය පිරිසිදුව හරියට කරන්න ඕන. ඒ වගේම සමහරු කියනවා සභාවෙන් තෙල් ලීටර 50ක් ගහන්න ගියහම, ලීටර් තිහක් ගහන්නේ. ඉතුරු 20ක් විතර, ඒවට මොනවද වෙන්නේ දන්නෙ නැහැ. ගහන තෙල් ප්‍රමාණය TO මහත්තරු බලන්න ඕන. මේ සභාවේ ජෙනරේටරයක් තියෙනවා. සභාව පටන් ගන්න වෙලාවට, ඒ ජෙනරේටරය තෙල් ගහල ෆුල් ටැන්ක් කරනවා. නමුත් ඊළඟ සභා වාරය වන විට නැවත තෙල් දාන්න වෙනවා. මේ පැය කිහිපයයි සභාව තියෙන්නේ. මොකක්ද මේකේ තත්වය. ඒ වගේම වාහනවලට ඉන්ධන ලබා ගැනීමේදී, සර්විස් කිරීමේ කටයුතුවලදී, සභාවෙ නිලධාරීන් ඉන්නවා. අදාළ කමිටු තියෙනවා. ඒ සම්බන්ධව අධීක්ෂණ කටයුතු සිදු වෙන්න ඕන. මම මේ සභාවෙ වෙන දේවල් ටිකයි කිව්වේ. ඔබතුමා මේ කටයුතු පරිපාලනය කරගන්න ඕන. එහෙම නැති වුණාම මිනිස්සු බනින්නෙ ඔබතුමාට. මේ වාහන වලට තෙල් ගහන අවස්ථාවෙ, පොළේ මුදල් එකතු කරන අවස්ථාවේ, ඒ වගේ යම් යම් අවස්ථාවල දී සිදුවන අක්‍රමිකතා නැති කරන්න ඔබතුමා කටයුතු කරන්න. යම් යම් දූෂිත කටයුතු නිසා, නාගොඩ ප්‍රාදේශීය සභාව අපකීර්තියට පත්වෙලා තියෙනවා. යම් යම් දේශපාලන මත දරන පුද්ගලයන් එකතුවෙලා, මේ සභාවෙ දේවල් මංකොල්ලකෑම් සිදු කරනවා. ඒ පිළිබඳව ඔබතුමා නැවත වාරයක් සොයාබලා අවශ්‍ය කටයුතු කරන්න කියලා ඉල්ලමින් නැවත වාරයක් අභිනව ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමාට සුභාශිංසන පිරිනමමින්, මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ප.ව1.30 පමණ ගරු සභාපතිතුමා හදිසි අවශ්‍යතාවයක් සඳහා අවසරගෙන සභාගර්භයෙන් පිටවයන ලදී. ඒ අනුව උපසභාපතිතුමා විසින් මූලාසනය හොබවන ලදී.**

**ගරු මන්ත්‍රිනී ඉනෝකා නෙරංජලී මහත්මිය**

ගරු සභාපතිතුමා ඇතුළු සමස්ත සභාවෙන් අවසරයි. පළමුවෙන්ම සතුටු වෙනවා. පහුගිය කාලේ තුට්ටුවකටවත් මායිම් නොකර සිටි රනිල් වික්‍රමසිංහ මැතිතුමා ජනාධිපති වීම සම්බන්ධව. ඇත්තටම අපේ කණ්ඩායමට සතුටක්. ඒ වගේම තමයි අපේ දිස්ත්‍රික් නායකතුමා අද පාර්ලිමේන්තුව නියෝජනය කරනවා. ඒ ගැනත් ඇත්තටම සතුටට පත්වෙනවා. මොකද අපි පහුගිය කාලයේ අති දුෂ්කර තත්වයකට පත්වුණා. මොකද ප්‍රධාන දේ පෙට්‍රල් නැතිව පෝලිම් වල ඉඳලා, අන්තිමට තෙල් නැහැ. අපට වඳුරඹ සෙඩ් එකෙන් තමයි අන්තිමට තෙල් ගහන්න හැකි වුණේ. නමුත් සමහර කොටසක් හැමදාම අපි ෆුල් ගහගන්නවා කියනවා. ගොඩක් අය පා ගමනින් ගමන් කළා. පුට් සයිකල් භාවිතා කලා. ඉතා දුෂ්කර කාලයක් තිබිලා, දැන් යහපත් තත්ත්වයක් රටට උදාවෙලා තියෙනවා. ඒ වගේම තමයි අපේ පාරක් තියෙනවා සභාපතිතුමනි, එකේ යන්න බැරි තත්ත්වයක් තියෙන්නේ. මම යෝජනා කරන්නේ කොරි පස් එකක් වත් දාලා ඒක පිළිසකර කර දෙන්න කියලා ඉල්ලමින්, මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු උප සභාපතිතුමා පිළිතුරු දෙමින්**

ඔබතුමියගේ යෝජනාව ලබන සභා වාරයේ න්‍යාය පත්‍රයට ඇතුළත් කරන්න.

**ගරු මන්ත්‍රී එම්.එම්. දිසානායක මහතා**

ගරු සභාපතිතුමනි, දීර්ඝ කාලයක් තිස්සේ කටඹුරාව ජනතාව යන සීටීබී බස් එක දැන් නැවතිලා තියෙන්නෙ. මම මීට පෙරත් කතා කළා. එක ප්‍රයිවට් බස් එකක් දුවනවා. නමුත් හැමෝටම එම බස් රථයෙන් ගමන් කරන්න බස් රථය ප්‍රමාණවත් නැහැ. ගාල්ලේ සිට කහඳුව ඉදිගහවිල දක්වා ධාවනය වන එම බස් රථය නැවත ධාවනයට යොදවන්න කියලා මම යෝජනා කරනවා. ගාල්ල දිස්ත්‍රික්කයේ තියෙන වැඩිම ආදායමක් ලබන බස් එක මේක. ළමුන් දැන් පාසල් යන නිසා

ඔවුන්ගේ පාසල් වාහන වලට 20000 ක් වැනි මුදලක් දෙමව්පියන්ට වැය කරන්න සිදුවෙලා තියෙනවා. ඒ නිසා විකල්පයක් ලෙස, මෙම බස් රථය ධාවනයට යොදවනවා නම්, එතරම් මුදලක් දරුවන් වෙනුවෙන් දරන්න බැරි දෙමව්පියන්ට ලොකු සහනයක් වේවි.

උනන්විටිය වදුරඹ මාර්ගයේ ලෙහුවල පාසල අසල බෝක්කුව ගිලා බැහැලා තියෙනවා. ජීවිත හානි වෙන්න පුළුවන්. විශාල අනතුරක් වෙන්න පුළුවන් ගංවතුර කාලයට. ඒ නිසා යකඩ තහඩුවක්වත් දාලා දෙන්න කියලා ඉල්ලනවා.

ඒ වගේම උනන්විටිය, නීල් ද අල්විස් මාවත, ඊරියවල කුරුන්ද අසළ මාර්ගයේ විශාල වලක් සෑදී ඇති බැවින්, ඒ සඳහාද යකඩ තහඩුවක් ලබා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

කොන්ත්‍රාත් සමාගම් වලින් විශාල ගල් ප්‍රමාණයක් බාලා තියෙනවා. නමුත් ගමේ මිනිස්සු ඇවිල්ලා, ඒවා විල්බැරැක්ක වලින්, ලෑන්ඩ් මාස්ටර් වලින් පටවගෙන යනවා. පාර හදන්න බාපු කළුගල් එ්වා නතර කළ දැම්ම නම් හොඳයි කියලා මම හිතනවා. වැඩිදුර අදහස් ප්‍රකාශ කරන්න යන්නෙ නැහැ. මම නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රිනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය**

ගරු උප සභාපතිතුමා ඇතුළු සමස්ත සභාවෙන් අවසරයි. මම මේ වෙලාවේ නැගී සිටියේ, අපේ වනමල් මන්ත්‍රීතුමා කිව්වා වගේ, දොරනවිල මාර්ගය සකස් කරලා දෙන්න කියපු ඉල්ලීම සම්බන්ධව යම් අදහසක් ඉදිරිපත් කරන්න. මගේ කොට්ඨාසෙ තිබෙන පාරක්. ඒ සම්බන්ධව කීප වතාවක්ම මම මේ සභාවට දැනුම් දීම් කලා. ඒ පිළිබඳව කිසිම වගකීමක් මේ වන විට ඉටු කරලා නැහැ. මම හිතන්නේ ඉතා අවදානම් තත්ත්වයක් මේ පාර තියෙන්නෙ. මේ වන විට තුනටිය කඩාගෙන දෙන්නෙක් ඉන්නවා. නොදන්න කෙනෙක් ගියහම, මේ වංගුවත් එක්ක නිසා විශාල පිරිසක් අනතුරට ලක් වෙලා තියෙනවා. මේ පිළිබඳව සභාවේ කිහිප වතාවක් කතා කරලා තිබුණත්, කිසිම පියවරක් අරගෙන නැහැ. ඒ නිසා මම හිතනවා අද දවස කතා කරන එකත් සෑහීමකට පත් වෙන එකත් නැහැ කියලා. ඒ වුණත් මම කතාකරන්නේ සභාවට අයත් දෙයක් නිසා. පාර සම්බන්ධ වෙලා තියෙන්නෙ වෙල්යායත් එක්ක. මීට කලින් යම් විදිහකින් මේ සම්බන්ධව වැඩ කොටසක් කළා නම්, එවක කුමන හෝ හොඳ ක්‍රියාමාර්ගයකට එන්න තිබ්බා. දැන්නම් මහා විශාල මුදලක් වැය කරන්න වෙයි කියන එක තමයි මගේ අදහස තියෙන්නේ. ඒ වුනත් පස් ටිකක් හරි දාලා, ඒ මාර්ගය පිළිසකර කර දෙන ලෙස ඉල්ලමින්, ඒ විතරක් නෙවෙයි එම මාර්ගයේ විශාල පිරිසක් ගමන් කරන මාර්ගයක්. මේ පිළිබඳව වනමල් මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ විදිහට, මම හිතනවා කුමන හෝ විදිහකින්, යම්තාක් දුරට හෝ පිළිසකර කර දෙනව නම්, විශාල මෙහෙවරක් වේවි. ඒක විශාල පිරිසක් පාවිච්චි කරන මාර්ගයක් නිසා ඒ පිළිබඳව අවධානය යොමු කරලා, එම පාර සාදා දෙන ලෙස ඉල්ලමින්, මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා**

ගරු උප සභාපතිතුමා ඇතුළු සමස්ත සභාවෙන් අවසරයි. දැන් මීට පෙර කතාවලට ඇහුම්කන් දෙන විට, මගේ කනට වැටහුනේ, අපේ කුමාරගේ වසන්ත මන්ත්‍රීතුමන් පැවසූ, උඩුගම පොළ ප්‍රශ්නය සහ තල්ගස්වල පොළ සම්බන්ධව. ඇත්තටම අපි ඒ පොළට ගියහම, වෙළෙන්දො අපට පවසනවා. ඒ පොළේ අපේ මුරකරු මහත්තයෙක් ඉන්නවා. නමුත් දාන සියලුම ලෑලි, ලබන සතියේ පොළ වෙද්දි නැතිලු. ඉන්පසු ඒ මිනිස්සු කඩවල්වලට ගිහිල්ලා, ඒ දොර ලෑලි අරගෙන ඇවිල්ලලු පාවිච්චි කරන්නේ. මුරකරුවෙක් සිටියදීත් මෙහෙම වෙන්නේ. මම මීට ඉහතදීත් කිව්වා. පොලේ වැසිකිලියෙ එක දොරක් ගලවාගෙන ගිහිල්ලා කියලා. ඒවට කිසිම

ක්‍රියාමාර්ගයක් අරගෙන නැහැ. ඒ වගේම උඩුගම පොළේ මට කිහිප දෙනෙක්ම ඒ සිද්ධිය කිව්වා. මෙහෙම මෙහෙමයි වෙන්නේ කියලා. ඇත්තටම අපටත් මේ සිද්ධි අහනකොට ලැජ්ජයි. ඔවුන් හැසිරුණ ආකාරය සම්බන්ධව. අපේ ලක්රුවන් මන්ත්‍රීතුමා පොළ අධීක්ෂණය කරනවා කිව්වා. ගිහිල්ලා බලන්න. වෙළෙන්දො එන්නෙ උදේ 5.00 ට විතර. වීදි ලාම්පුවක් වත් නැහැ. පොළට කරුවලේ තමයි බඩු ටික දාන්නේ. උදේ 5.00 වන විට කොටසක් ඇවිල්ලා සල්ලි එකතු කරගෙන යනවා. කෙසෙල් කැන් ගන්න, කරපිංචා, කොච්චි ටික විකුණන වෙනම කොටසකගෙන් සල්ලි එකතු කරගෙන යනවා. මම උදේ ගිහින් ඇහුවා. නමුත් කිසිම නිලධාරියෙක් ගිහින් නැහැ. නිලධාරින්ගේ වරදක් නැහැ. මොකද හවසට තමයි මුදල් එකතු කරන්න කියලා ඔවුන් යන්නේ. 150.00 ගානෙ තමයි එකතු කරන්නේ. එක මාළු වෙළෙන්දෙක් ඇතුළෙ ඉන්නවා. තුන්දෙනෙක් එළියෙ ඉන්නවා. ඔය සියලුම වෙළෙන්දො ටික ඇතුලට දානවා නම්, ප්‍රශ්නයක් නැහැ. වෙනම කල්ලියක් ඉන්නවා මේවා එකතු කරන්න. එයාලා ආරක්ෂා කරන්නත් කට්ටියක් ඉන්නවා. අපි දැන් මෙහෙම කිව්වහම, ලබන සතියේ, මේ මන්ත්‍රීතුමා තමයි මෙහෙම කිව්වේ කියලත් කියනවා.

ඒ වගේම තමයි ගරු සභාපතිතුමනි, දැන් මේ ගොවීන් ටික බලාපොරොත්තු වුණා ගොවිතැනට පොහොර ලැබෙයි කියලා. අපිත් ගොවිතැන් කලා. නමුත් අපට තවම පොහොර ටික ලැබිලා නැහැ. දැන්නම් පෝර ටික වැඩකුත් නැහැ. දැන් කරල් කිරට නැමිලා තියෙන්නේ. තවම කොටසකට තමයි පොහොර ලැබිලා තියෙන්නෙ. ඒ පිළිබඳව සොයා බලන්න ගරු සභාපතිතුමනි, ඒ වගේම පාසල් ළමුන් ප්‍රවාහනයේදී දැන් ලැබෙන ඩීසල් ප්‍රමාණයත් මදි.

අනිත් එක තමයි ග්‍රාමීය රෝහල්වල බෙහෙත් නැහැ. හොයලා බලන්න තල්ගස්වල ග්‍රාමීය රෝහලේ බෙහෙත් ටික නැහැ. මෙතුමිය කියනවා රනිල් මහත්තයා ආපු නිසා, අපට සතුටුයි කියලා. බලන්න බඩුමිල වැඩිවෙලා තියෙනවා. සැමන් එකක් රු. 750.00 යි. හැමදේම වැඩියි. එහෙම නම් කොහොමද සතුටු වෙන්නේ. සතුටු වෙන්න නම්, මේ දේවල් අඩු වෙන්න ඕන. ගිය සභාවේ දී, මෙතුමා කිව්වා. ජනතා විමුක්ති පෙරමුණ තමයි ත්‍රස්තවාදීන් කියලා. ත්‍රස්තවාදීන් ගැන මෙතුමා දන්නෙ නෑ. මම හිතන්නේ ඔබතුමා, ඔබතුමාගේ නායකයන්ගෙන් අහන්න ඒ ගැන. දැන්නම් ඒ දේවල්, ත්‍රස්තවාදී ක්‍රියා සිද්ධ වෙනවා. මිනී මරනවා ගෝනිවල දාලා. ගෝල්ෆේස් එක එහා පැත්තේ කොඩි තියාගෙන නිදාගෙන හිටියා කියලා අත්අඩංගුවට ගත්තා. ස්විමින් පූල් එකේ හිටියා කියලා අත්අඩංගුවට ගත්තා. ඔන්න ත්‍රස්තවාදය. අපි තමයි එතුමව පුටුවෙ වාඩි කළේ. එතුමා කරන්නේ, අපේ අය හිරේට ගන්නවා. නමුත් ඉන්න හොරු ටික ආරක්ෂා කරනවා. ගෝල්ෆේස් එකේ හිටපු සහෝදරයෝ ටික නැත්නම්, අපට පෝලිම් වල මැරෙන්න වෙන්නේ. මහ දවල් මහ බැංකුව කඩපු හොරු, ඇවන්ගාඩ් කාපු හොරු තමයි ඉන්නේ. ස්විමින් පූල් වල නැවා කියලා මොනවත් වෙන්නේ නැහැ. වතුර ටික අයින් කරහම ඉවරයි. ඒ වගේම ග්‍රාමීය රෝහල් ටිකට බෙහෙත් ටික දෙන්න. අපේ දරුවන්ගේ පාසල් වාහන ගාස්තු, පොත් පත් මිල අඩු කරලා දෙන්න කියලා ඉල්ලනවා. නාගොඩ සතොසෙන් කොටසකට පමණක් මිල අඩු කරලා භාණ්ඩ දෙන ක්‍රමයක් තියෙනවලු. ඒ ක්‍රම නිරීක්ෂණය කරන්න.

**ගරු උප සභාපතිතුමා පිළිතුරු දෙමින්**

ස.තො.සෙ. සමහර භාණ්ඩ මිල අඩුවෙලා ආවම, එහෙම දෙන ක්‍රමවේදයක් තියෙනවා. අඩුවට නම් දෙන්නෙ නැහැ.

**ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා**

මම යෝජනාවක් ගේනවා. මම ඉල්ලා සිටිනවා. අපි තේ පැන් සංග්‍රහය නවත්තලා හරි, මෙන්න මේ මාධ්‍යවේදීන් කැඳවන්න කියලා.

තව යෝජනාවක් තියෙනවා ගරු සභාපතිතුමනි, නිසි වෙලාවට සභාව පටන් ගමු කියලා මම ඉල්ලා සිටිනවා. ඒ ගැනත් අවධානය යොමු කරන්න කියලා ගරු සභාවෙන් ඉල්ලා සිටිමින්, මම නිහඬ වෙනවා.

**ගරු උප සභාපතිතුමා පිළිතුරු දෙමින්**

ගමේ සමුපකාරයට පරිප්පු ටික එනවා. කිලෝ එක බැගින් දෙන්න, එහෙම ක්‍රමවේදයක් ආවා නම්, කළමනාකාරතුමා ඒ අයට හිතවත් අයට කතා කරනවා.

මාධ්‍යවේදීන් සම්බන්ධව කතා කරනවා නම්, මුදල් ගෙවලා සම්බන්ධ කරගෙන නැහැ. අපට ඕන නම් මේ අවස්ථාවට නියෝජිතයෙක් කැඳවන්න කියලා දැනුම් දීමක් කරන්න පුළුවන්. මේවා මාධ්‍යයට දීලා, කරන්න පුළුවන් වැඩ නෙවෙයි. ඔබතුමාත් මේ සම්බන්ධව උනන්දු වෙන්න. එයාලා ස්වෙච්ඡාවෙන් ඉදිරිපත් වෙන්න ඕන. අපි උනන්දු වෙන්නම් ඔබතුමත් උනන්දු වෙන්න ඕන. ඕනම නීත්‍යානුකූල හැඳුනුම්පතක් තියෙන මාධ්‍යවේදියෙක් කැඳවන්න.

අපි සභාව පෙ.ව.9.00 ට ආරම්භ කරන්න න්‍යාය පත්‍රයේ තිබුනත්, 9:30 වෙනකන් අපට බලන්න පුළුවන්. ප්‍රමාද වුනා නම්, මම සභාපතිතුමාට ඉදිරිපත් කරන්නම්, ඊට අවශ්‍ය කටයුතු කරන්න කියලා.

**ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මහතා**

ගරු උප සභාපතිතුමා ඇතුළු සමස්ත සභාවෙන් අවසරයි. අද මම හිතන්නේ රටේ අර්බුදකාරී වාතාවරණයෙන් මිදිලා, ඔබතුමා ඇතුළු මේ ප්‍රදේශයේ සියලු දෙනා ඒ ප්‍රශ්නවලින් ක්‍රමානුකූලව මිදෙමින්, බලාපොරොත්තු තැබිය හැකි යහපත් තත්වයක් කරා රට යන මොහොතේ අපේ ජයවීර මන්ත්‍රීතුමාගේ සමහර කතා වලට එකඟ වන නමුත්, තවත් සමහර කතා වලට එකග නැහැ. එතුමා කියපු රුපියල් 750.00 සැමන් ගැන කිව්වොත් දවසෙන් දෙකෙන් ඒවා අඩු කරන්න අපට බැරි වෙයි.

මේ රටේ තිබ්ච්ච ප්‍රශ්නය ඔබ දකින්න ඇති. පසුගිය කාලයේ වෙච්ච දේවල් දකින්න ඇති. ඉස්සර රුපියල් 60ට 70ට ඉන්ධන ගත්තා. මමත් පාසල් බස් රථ හා ප්‍රවාහන සේවා වල යෙදෙනවා. අද රුපියල් 450ට රුපියල් 460 ට වැඩි වෙලා, ක්‍රමානුකූලව දැන් අඩුවේගෙන යනවා. මම හිතන්නේ තව ඉස්සරහට තවත් මිල අඩුවෙයි. තව මාස දෙක තුනක් යනවිට රට යහපත් තත්වයට හැරෙමින් පවතිනවා. ඒ සඳහා බාධා කිරීම නොවෙයි අපේ යුතුකම. එතුමට කරන්න ඇරලා අපි සහයෝගය දීලා බලන් ඉන්න ඕන. ඉවසලා ඉන්න කියලා කියනවා. ඒ වගේම ගිය 18 වෙනිදා උඩුගම පොල ගැන මෙතන කතා වුණා. සභාපතිතුමා මගේ නම කිව්වා. ඔබතුමත් පොලේ එම අවස්ථාවෙදි හිටිය කියලා. මමත් හැම සඳුදම පොළේ යනවා. මම යන්නෙ නිලධාරී ප්‍රශ්න බලන්න නෙවෙයි. ගෙදරට අවශ්‍ය බඩු ටික ගන්න. එදා ඔය කියන දවසේ, සභාපතිතුමා එදින රෑ මගෙන් කතා කරලා අහනවා. පොලේ යම් සිද්ධියක් වුණා. දැක්කද කියලා. මම කිව්වා දැක්කෙත් නැහැ. දන්නෙත් නැහැ කියලා. නෑ නෑ ඔබතුමා හිටිය කිව්වා. මම මේ සිද්ධිය සම්බන්ධව සොයා බලන විට මේ සිද්ධියෙ වෙලා තියෙන්නේ, සභාවේ ආදායම් පරිපාලකතුමාට ගහලා තියෙන්නෙ, සභාවේ සුළු සේවකයන් පිරිසක් මේකෙ අනියම් සේවකයො ඉන්නවා.ස්ථිර සේවකයො ඉන්නවා. ඉතින් ඒ අය ගැන මේ අවස්ථාවේදී මම කතා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. සභාපතිතුමා කියනවනේ අපි හිටිය කියලා. ඒකයි මේ පිළිතුර දෙන්නේ. අපි දැක්කේ නැහැ. නමුත් යම් ගැටුමක් සිද්ධවෙලා තියෙනවලු. ඒ සිද්ධිය පිළිබඳ වැඩිදුරටත් හොයල බලපුවහම, සභාවෙන් තමයිලු දැන් පස්වෙනි මාසෙන් පස්සේ පොලවල් දෙකම කරන්නේ, ආදායම එකතු කරන්නේ. තල්ගස්වල පොල තියෙන දවසටත්, උඩුගම සේවකයො තල්ගස්වල පොලටත් යනවලු. රාජකාරියට පිටින් ගිහිල්ලා, එතන ගිහිල්ලා, ආදායම් පරිපාලකතුමාගෙන් ද මම දන්නෙ නැහැ. එතන ගිහිල්ලා, යම් යම් ඉල්ලීම් කරනවලු. ඕකෙන් ආදායමක් එනවා ඇති. වෙනත් ආකාරයට

අපට අරක්කු බෝතලයක් අරන් දෙන්න කියලා බලපෑම් කරනවාලු. ඒ වගේම උඩුගම තියෙන සඳුදා පොළටත් ඒ වගේ පිරිසක් එකතු වෙනවා. උඩුගම ඇප්තොප්වත්තේ වැඩ කරන සේවකයො රියදුරු, ආරක්ෂක නිලධාරී ලෙස සේවය කරන නිලධාරි මහත්වරු පවා ඉදලා තියෙනවා. සභාවෙ වැඩකරන ස්ථිර කාර්යාල සේවකයො පවා යම් මුදලක් ඉල්ලලා කියලා ආරංචියි. සෙවිය යුතු කරුණක්. ඉල්ලන මුදලක් එතුමගේ වැටුපෙන් ඉල්ලන් නැනෙ. එතන අක්‍රමිකතාවයක් වෙනවා ඇති. ඒ නිසා තමයි මේගොල්ලෝ ඉල්ලන්නේ. ඒ ඉල්ලුවට පස්සෙ කොහොම හරි බහින්බස් වෙලා, ආදායම් නිලධාරීතුමාගෙ අම්මා මතක් කරලා, එක් නිලධාරියෙක් බැනලා. අන්තිමට බහින්බස් වෙලා, ආදායම් පරිපාලකතුමාට යම් පිරිසක් එකතුවෙලා, ගහලා, ඇත්තටම එතුමා පැමිණිල්ලක් කරන්න නැතිව ඇත්තේ, එතුමන්ට ප්‍රශ්නයක් නැතුව ඇති. එයා පැමිණිලි නොකරනවානම්, ඒක එතුමගේ ප්‍රශ්නයක්. නමුත් රාජකාරි වෙලාවේ, රාජකාරි නිල ඇඳුමෙන් එහෙම පහරදීමක් වෙලා තියෙනවා නම්, අපට ඒක ලඝු කොට සලකන්න බැහැ. සභාවෙ ස්ථානයක්. සභාවේ පොදු ස්ථානයක්. එහෙම වෙනවනම්, සභාවෙ නාමයටත් හොද නැහැ. ඒ නිසා මේ සිද්ධිය සම්බන්ධව පරීක්ෂණයක් කරලා, ඒගොල්ලන්ට මොන යම් හෝ දඬුවමක් දිය යුතුයි. මොන මට්ටමේ නිලධාරීන් වුනත්, මේ සභාවේ මේ සිද්ධියට, සම්බන්ධ අයට නිසි දඬුවමක් නොදුන්නොත්, මෙම සභාවේ විනය පවත්වා ගැනීමට නොහැකි වෙනවා. මේක ආරම්භයක් විතරයි. මෙයට නිසි ක්‍රියාමාර්ගයක් නොගතහොත්, මේ සභාවේ මේ සම්බන්ධව කතා කරන මන්ත්‍රීවරුන්ට පවා ගැටළුවක් වේවි. මේ මන්ත්‍රීවරයෙකුට පවා පොළට යන්න නොහැකි වේවි. මොකද මෙහෙම ප්‍රශ්නයක් සභාවෙ කතාවෙනවා. මේක මග අරවන්න බලන්න. මොකද මේ සම්බන්ධව ඔබතුමා කතා කරල තියෙනවා. සභාවේ කියලත් තියෙනවා. මෙහෙම ප්‍රශ්නයක් කතා වෙනවා සභාවේ. නමුත් අපි එහෙම වෙන්න ඕනේ නැහැ. ඒ නිසා මේ සම්බන්ධව විධිමත් පරීක්ෂණයක් කරලා, නිසි දඬුවම් ලබා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

ඒ වගේම මම කතා කරන්න ආ ගොඩක් කාරණා අපේ වනමල් මන්ත්‍රීතුමා වගේම අනිකුත් මන්ත්‍රීවරු කතා කළා. මම කතා කරන්න ආ කාරණා සම්බන්ධව මම වැඩිදුර කතා කරන්න යන්නේ නැහැ. මොකද අපේ මන්ත්‍රීවරුන්ගෙ කතාවලින් කියවුනා. ඒ වගේම ගරු උප සභාපතිතුමනි, උඩුගම පොලේ ලයිට් නැහැ. වෙළෙන්දො අපට 150.00 / 200.00 ගෙව්වට, වෙනම තල්ගස්වල පැත්තෙන් කෙනෙක් ඇවිල්ලා, රුපියල් 60.00 ට වයර් ඇදලා, ලයිට් දාලා යනවා. නමුත් වෙළෙන්දෝ අපහසුතාවයට පත් වෙනවා. සභාවට මුදල් ගෙවන්නත් ඕන. මේ ලයිට් දාන මනුස්සයට ගෙවන්නත් ඕන. සභාවෙන් මේවා යොදවනවා නම් හොඳයි. ඒ වගේම උඩුගම පොලේ වාහනයක් හප්පලා, බෝඩ් එකත් කුඩු කරලා තියෙනවා. මම දැක්කා කොච්චර සේවකයො හිටියත්, පොළ කරන අයවත්, කවුරුවත්, සභාවෙ සේවකයොවත් සොයලා බලලා නැහැ. ලොකු ගානක් වියදම් කරපු බෝඩ් එකක්. ඒ ගැනත් හොයල බලන්න. මොකද ඒක දැන් රජයේ දේපලක් නේ.

ඒ එක්කම මම මීට ඉහතදී මේ සභාවේ ඉල්ලීමක් කළා. අපේ වනිගරත්න මන්ත්‍රීතුමාගේ කොට්ඨාශයටත් අදාලයි. උඩුගම - ඉහළගම බස් රථය නැවතත් ධාවනය කරන්න ඉල්ලීමක් කරමු කියලා ඉල්ලීමක් කළා. මිනිස්සුන්ට රු.600.00 ක් 700.00 ක් යනවා ත්‍රීවිල්වලින් උඩුගමට ඇවිල්ලා බස්වල යන්න. ඒ සම්බන්ධව මම හිතන්නේ සභාවෙන් ලිඛිතව ඩිපෝවට මේ ගැන දැනුම් දුන්නා. නමුත් මේ වන විටත් ඒ කිසිම දෙයක් සිදුවෙලා නැහැ. අපේ මට්ටමිනුත් ඒ සඳහා කටයුතු කරන්න අපි බලාපොරොත්තු වෙනවා. සභාවෙනුත් මම බලාපොරොත්තු වෙනවා, ඒ ගැන නැවතත් දකුණු පළාත් කළමණාකාරතුමා ගෙන් හරි, ශ්‍රී ලංගම හරි අහලා අවශ්‍යතාව පහදා දීලා මෙම බස් රථය ගමනාන්තය දක්වා ධාවනය කරන්න කටයුතු සළසා දෙන්න කියලා. ඒ ගමේ මිනස්සු අනවශ්‍ය ලෙස මුදල් වියදම් කරන්නේ තෙල් නැති ප්‍රශ්නය නිසා. ඒ නිසා ඉහලගම ජනතාව අපහසුතාවයට පත්වෙනවා.

ඒ වගේම උඩුගම කොම්පෝස්ට් ව්‍යාපෘතිය බැලුවම, නිරන්තරයෙන් කිහිප දෙනෙක් ඉන්නවා. උදේ රාජකාරියට එනවා. ඒගොල්ලො යම් වැඩ කොටසක් සභාවට කරල තියෙනවද? යම් ආදායමක් සභාවට එනවද කියලා. ඒ වගේම පොල් ඉඩම්වල ආදායමක් සභාවට එනවද? දර කැපුවා කියලා, පොල් කැඩුවා කියලා යම් ආදායමක් සභාවට එනවද කියලා අපි දැකලා නැහැ. ලේකම්තුමියටත් වගකීමක් තියෙනවා ඒව ගැන මොනවා හරි වෙනවා නම් බලන්න. ආදායම හා සේවාව ලැබෙනවද කියලා සොයලා බලන්න. ගෙවන වැටුප සාධාරණව ගෙවන්න කියලා ඉල්ලා සිටිනවා.

ඊළඟට උපකාර්යාලය ගැන කතා කරනවා නම්, එහි නඩත්තුවක් නැතුව ජරාජීර්න වෙලා තියෙන්නෙ. මම උප කාර්යාලය අසළ ගෙදරට ගියා. එවෙලේ දැක්කා. උප කාර්යාලය කැලෙන් වැව්ලා, වාහනය යන කොටස විතරක් මතුවෙලා තියෙනවා.සේවකයන් යොදවලා ඒ පිරිසිදු කිරීම් කටයුතු කරවන්න කියලා ලේකම්තුමියගෙන් ඉල්ලනවා. මම හිතන්නේ අපේ සභාව සේවකයන්ගේ විනය මීට වඩා ගුණාත්මක ආකාරයෙන් පවත්වාගෙන යාමට කටයුතු කරනවා නම් හොඳයි.

අපේ සභාවේ මීට පෙර හිටපු සභාපතිවරු ඉන්නකොට සේවකයන්ගේ යම් කිසි විනයක් තිබුණා. එම විනය අද වන විට නැතිවෙමින් යනවා. ඒ කාලයේ සභාපතිවරයා හා මන්ත්‍රීවරු එන විට සේවකයන් හැසිරෙන විදිහ හා වර්තමානයේ හැසිරෙන විදිහ අතර ලොකු වෙනසක් තියෙනවා. ඒක එච්චර හොඳ තත්ත්වයක් නෙවෙයි. RO මහත්තයා සම්බන්ධව ගිය සභාවේ යම් දෙයක් කතා වුණා. ඒක මම දන්නේ නැහැ ඇත්ත නැත්ත මොකක්ද කියලා. නමුත් මේ සභාව වන විට ඊටත් වඩා දෙයක් වෙලා, සුළු සේවකයෝ පිරිසක් එකතු වෙලා, එතුමට ගහලා තියෙනවා. සුළු සේවකයෝ මේ වගේ වෙනවා නම්, මේ සභාව නොතිය, ඒගොල්ලන්ට ම පාලනය භාර දෙනවා නම් වඩා හොඳයි. ඒ ගැන විශේෂ අවධානයක් යොමු කරන්න කටයුතු කරන්න කියලා ඉල්ලනවා. ඒවගේම ගියසුමානේ සේවක රැස්වීමක් අරගෙන, ඒ සම්බන්ධව කතා කරලා තිබුනත්, මම හිතන්නේ මහා ලොකු දෙයක් වෙලා නැහැ. ඒ සම්බන්ධව සොයා බලන්න කියලා ඉල්ලමින්, ඔබතුමාලා බලාපොරොත්තු වෙච්ච, නැවතත් බඩු මිල අඩු වෙලා. ගෑස්, තෙල් මිල අඩු වෙනවා. තව මේ කෙටි කාලයේදී අපේ සහයෝගය ලබා දෙන්න ඕන. අපේ රනිල් වික්‍රමසිංහ මහත්තයා රටේ ජනාධිපතිවරයා බවට පත්වෙලා තියෙනවා. අරගලය හේතුවෙන්. නමුත් අපේ ජයවීර මන්ත්‍රීතුමාලට ඒ ගෞරවය තනිකර දෙන්න බැහැ. මොකද එක එක කාලයට එක එක අය මේ අරගලයේ හිටියා. එක්සත් ජාතික පක්ෂයේ අයත් හිටියා. ජනාධිපතිවරයාගේ මාධ්‍ය අධ්‍යක්ෂකවරයා හිටියා. ඒ වගේම, එතුමා ජනාධිපති කරන්න සහයෝගය දැක්වූ සියලු දෙනාට ස්තුතිවන්ත වන අතර, රටේ දැවෙන ප්‍රශ්න වලට මුහුණ දෙන්න නව ජනාධිපතිවරයාට හැකියාව ලැබේවායි කියා ප්‍රාර්ථනා කරමින්, මම නිහඩ වෙනවා.

**ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා**

ගරු සභාපතිතුමනි, මම පොළෙන් පටන් ගන්නවා. 2022 ජනවාරි, පෙබරවාරි මාසේ ඉඳලා පොළ ආදායම සම්බන්ධයෙන් හොඳට පිළිවෙලට කටයුතු වෙලා තියෙනවා. ජනවාරි සිට ජුනි මාසය සාමාන්‍ය කොරෝන මට්ටමේ තිබුණේ. ඒ වනවිටත් ආදායම රුපියල් 8000.00, 9000.00 යි. වැඩිපුර මුදලාලිලා එන්න පටන් ගත්තේ ඊට පස්සේ. පස් වෙනි මාසය වන විට පොළේ ආදායම් තත්වය බහිනවා. 2250.00යි, 3500.00 යි. ඒක පිළිවෙලකුත් නැහැ. පත්වීම ලැබිච්ච මුල් අවධියේ ඕනෑම මනුස්සයෙක් හොඳයි. කන්න බොන්න පටන් ගත්තට පස්සේ මේකට හැඩහුරු වෙලා, මෙන්න කරපු දේ. නිසි ක්‍රමවේදයකින් තොරව කටයුතු කරලා කියලා, නිර්භයව මම කියන්නේ. මම ගිය මාසේ මේ සම්බන්ධව කතා කළා. එදා කිව්වේ තල්ගස්වල පොළේ ගැටුමක් ඇති කර ගෙන කියලා. අද කියනවා උඩුගම පොළෙත් ගැටුමක් ඇති කරගෙන කියලා. එම නිලධාරීයා මේ

සභාව බලාගෙන ඉඳියි කියලවත්, මේ සම්බන්ධව ගරුත්වයෙන් සැලකුවෙ නැහැ. මම ගිය සභාවෙ හරියාකාරව ඒ දේ කිව්වා මෙතන, කියලා බලනකොට ගුටිත් කාල ඉවරයි. එම නිලධාරියා කියනවා. වැඩක් නැහැ. පොලිසි ගියේ නැහැ කියලා. යම් කිසි ලෙසකින් මේ නිලධාරියාට රාජකාරි වෙලාවේ යම් අනතුරක් වුනානම්, සභාව වගකියන්න ඕන. ඔබතුමාටත් එසේ නොවේවි කියලා හිතන්න බැහැ. ඔබතුමාටත් තිබුනා පොලීසියට ගිහිල්ලා පැමිණිල්ලක් දාන්න. සභාවේ නිදහසට. මොකද යම් කිසි අනතුරක් වුණා නම්, එම නිලධාරියාගේ ගෙදරින් ඇවිල්ලා හොයන්නේ මේ සභාවෙන්. මොකද නිලධාරියා උදේ අටේ සේවයට වාර්තා කරලා තියෙනවා. එහෙමනම් සභාව වගකියන්න වෙනවා.

**ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මහතා ප්‍රශ්න කරමින්,**

ගරු සභාපතිතුමා ඔය සිද්ධිය වෙලා තියෙන්නෙ කීයටද?

ගරු සභාපතිතුමා පිළිතුරු දෙමින්,

4 ½ න් පසුව. එතන තරංග මන්ත්‍රීතුමාත්, ධර්මසිරි මන්ත්‍රීතුමාත් ඉඳලා තියෙනවා. මට කෙනෙක් කිව්වා.

**ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මහතා**

මම යන්නේ 6 ½ ට, මගේ දරුවා පන්තියට දාලා. ඔබතුමාට ඔය කියපු කෙනාට වඩා මාව විශ්වාස නැද්ද?

**ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා**

කරුණාකරලා මේ සේවකයා පොළේ සල්ලි එකතු කිරීම නවත්තලා, ඔහුව මාරු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා. මේ නිලධාරීයා සභාවේ තියාගත්තොත්, මුළු සභාවම විනාශ වෙනවා.

**ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මහතා**

මේ නිලධාරියා විතරක් මාරු කරන්න එහෙම බැහැ. මොකද එම නිලධාරීයා දැන් ගුටිත් කාලනෙ ඉන්නේ. එම නිලධාරියට ගහපු අයත් මාරු කරන්න ඕන.

**ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා**

ගහපු අයත් එකයි. ගුටිකාපු අයත් එකයි. ඊළඟ සභාව වන විට පරීක්ෂණයක් ඕන. මගේ සානුකම්පිත බැලිල්ලක් තියෙනවා එක සැරයක්. මේවා වාර්තාගත කරන්න කියලා බය නැතුව මම ඉල්ලා සිටිනවා. මේ ගැටුම් ඇති කරගත්තෙ කොහොමද කියන එක සම්බන්ධව පැහැදිලි වාර්තාවක් ඉල්ලලා, සභාවට ඉදිරිපත් කරන්න. මම කොමසාරිස්වරයාටත් පැමිණිලි කරලා කියනවා. නිලධාරීන් මේ සම්බන්ධ පියවරක් අරගෙන නැහැ කියලා. පෙර ප්‍රශ්නය ඇතිවෙද්දිත්, ගිය සභාවේත්, පරීක්ෂණයක් කරන්න කියලා මම කියලා ඇති. අවවාද කළත් මිනිහා හැදිලත් නැහැ. ආයතනයේ ගරුත්වය විනාශ කරලා ඉවරයි. මේ සභාව විනාශ වෙනවා. හැමදාම කුණුගොඩක් අල්ලන් දඟලන්න බැහැ. ඔබතුමාලා හැමෝම කතා කරන්නේ මේ ප්‍රශ්නය සම්බන්ධව. එක නිලධාරියෙක් නිසා කාලය නාස්ති කරනවා. මම මේ වෙලාවෙ යෝජනා කරනවා ඊළග සභාව වන විට කොමසාරිස්වරයට කියලා, පරීක්ෂණයක් කරලා මේ සේවකයා මේ සභාවෙ තියාගන්න එපා කියලා. මම මේ වෙලාවේ වැඩිය ඒ ගැන කතා කරන්නේ නැහැ.

මීළඟට මත්පැන් සම්බන්ධව කතා කරනවා නම්, අපේ ගමේ හැම අස්සක්, මුල්ලක් නැරම මේ මත්පැන් උවදුර වෙලාගෙන තියෙනවා. කොයි පැත්තට ගියත් බඩු තියෙනවා. අපි මේ කතාව යම් විදිහකින් දැනුම් දුන්නොතින්, මෙන්න මත්පැන් තියෙන තැන් කියලා, අපට ලබන සභාවේ වාර්තාවක් එනවා. නඩු අපි අරගෙන තියෙන්නෙ කියලා. නඩු ගාන හරි. මේ මොහොත වන විට,

මේ මත්පැන් පානය නිසා, රටේ මිනීමැරුම් සිද්ධ වෙලා තියෙනවා. 26 ක් 27ක් කපලා කොටලා වෙඩිතියලා, උසාවියෙත් වෙඩි තිබ්බා. මේ සියලු දේවල් මත්ද්‍රව්‍ය නිසා සිදුවන දේවල්. එහෙමනම් කරුණාකරලා මේ මත්ද්‍රව්‍ය උවදුර නැති කර ගන්න ඕන. අපි ගම්වල ඉන්න විසි හත් දෙනෙක් ඉන්නේ. මම කියනවා. තමුනාන්සෙට මේ පිළිබඳව දැඩි අවධානය යොමු කරන්න කියලා. මේක පොලිසියට භාර දීල වැඩක් නැහැ. සෙල්ලම් පිස්තෝලයක් අරගෙන, සෙල්ලම් කරනවා වගේ වැඩක්. ඒ නිසා මම මේ දේ STF එකට බාර දෙන්න කියලා යෝජනාවක් දානවා. තමුන්නාන්සේ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට යනවනම්, ඒකට යෝජනාවක් දාන්න. ඇත්තටම අපේ ප්‍රදේශයේ හැන්දෑවේ හයෙන් පස්සේ ගෑනු දරුවෙක් පන්තියකට ගිහිල්ලා, තනියම ගෙදර යවන්න බයයි. ඒ පාරේ මිනිස්සු බීගෙන, නොගැලපෙන ලෙස හැසිරෙනවා. එකේ හොඳම ලැජ්ජ නැති වැඩේ තමයි, ගමේ තියෙන ආරක්ෂක කමිටුවෙදි, ගමේ හාමුදුරුවෝ හොඳ බණපදයක් දේශනා කරලා, මුලසුන ගන්නවා. හැමෝම අහගෙන ඉන්නවා. පොලිස් නිලධාරි මහත්වරු ඇවිල්ල මූලාසන කථාව කරල යන විට, අත්පුඩිත් ගහනවා. හැන්දෑවෙ විසිරිලා යන විට අර හාමුදුරුවොත් පවක් කරගෙන. නිලධාරීනුත් පවක් කරගෙන. ඒත් කසිප්පු තිප්පොළවල් නැවතිලා නැහැ. මේවට වග කියන්නෙ කවුද? එදා පොලිස් යුනිෆෝම් එකක් දකින විට, පාරක මනුස්සයෙක් ඉන්නේ නැහැ. ඊයේ අපේ පැත්තෙ පොලිසියෙ කෙනෙකුටත් බීපු කෙනෙක් ගහලා. මොකද අල්ල ගන්නවනම්, තිප්පොළවල් අල්ල ගන්න. මාව අල්ලගන්නෙ නැතුව කියලා. ඒකයි වර්තමාන තත්ත්වය. අපි මේ ආණ්ඩුව ආව කියලා, වැරදි දේ නිවැරදි කරන්න යන්නේ නැහැ. අන්න ඒ නිසා දැඩිව මේ වගකීම අපි ගාව තියෙනවා. අනාගත පරපුර විනාශ වෙන්න දෙන්න බැහැ. ඔවුන් වෙනුවෙන් මම අද මේ දේ කතා කළේ. මට අවාසි වෙන්න පුළුවන්. නමුත් හරි දේ කතා කරලා ඕනේ තරම් අවාසි වුනාට කමක් නැහැ.

ඒවගේම දැන් අධ්‍යාපනයත් විනාශ වීගෙන යන්නේ. මේ වෙලාවේ අපි ආදර්ශයක් වෙන්න ඕන. අපි වැඩිහිටියෝ හැටියට, ස්ටාලින් මහත්තයා ඉන්නවා ගෝල්ෆේස් එකට හරි කොටුව දුම්රිය ස්ථානයට හරි ගිහිල්ලා අල්ලගත්තම එයා තමයි කෙනා කියලා හිතන් ඉන්නෙ. මේ සමාජයේ අනාගත පරපුර වෙනුවෙන් වචනයක් කතා කරන්නේ නැතුව, ඉස්සර අපි ගුරු මව්වරුනි ,පියවරුනි කියපු උදවිය පාරට බස්සගෙන කරන දේවල් අපි අනුමත කරන්නෙ නැහැ.

දැන් ගෑස් ටික, තෙල් ටික දෙනවා. 40000.00 ට දීපු යූරියා දැන් 10000.00ට දෙනවා. ඒකෙ ප්‍රයෝජනය ගත්තෙ තමුන්නාන්සෙලා. කියන ඉක්මනට සැමන් එක ලාභ කරන්න බැහැ. මේ ජනාධිපතිතුමා පැන්නෙ ගිනි ගොඩකට. දැන් පරිප්පු, රට ලූණු ආදිය ලාබයි. සියලු දේ මිල අඩුවෙලා. එකපාරට කරන්න බැහැ. ඔබතුමාලා බලාගෙන ඉන්න මිළ අඩුවෙයි. තේ කිලෝ එකක් රුපියල් 300.00 යි. තේ මිල වැඩි වෙලා. ඕක තමයි සංවර්ධනය කියන්නේ. ජනතා විමුක්ති පෙරමුණේ මහත්තරු පොඩ්ඩක් බලාගෙන ඉන්න. ඒ නිසා අපි කාලය මීට වැඩිය ගන්නේ නැහැ. වාසුදේව මහත්තයා කියනවා. IMF එකට යන්නේ වසලයෝ ලු. එතුමගෙ දරු මුණුපුරෝ ජීවත් වෙන්නෙ විදේශ රටවල. නමුත් එතුමා ගේන්නේ මෙවැනි බොළඳ තර්ක. IMF එකට නොගිහිල්ලා මේ රට හදන්න බැහැ. ඊලගට වාර්තාවෙ මගේ කතාව යටතේ පිටු 10 ක් ලිව්වත් වැඩක් නැහැ. මගේ අවශ්‍ය දේ ලියලා පරීක්ෂණ කරලා, ගනිපු තීන්දු තීරණ ටිකත් ඒකෙ ලියලා එවන්න. මෙන්න මේකයි ප්‍රතිඵල කියලා.

තෙල් සම්බන්ධ ගැටලු තියෙනවා. ඒ සම්බන්ධව සොයා බලන්න නිලධාරියෙක් යොදවන්න.

ඒ වගේම පොළ සම්බන්ධව හා පොළේ ආදායම සම්බන්ධ තොරතුරු ඉල්ලනකම් දුන්නෙ නැහැ. වාහන සීයක් ගෙනත් තියන්න. එක නිලධාරියායි යන්න ඕන. ඒ නිලධාරියා තමන්ගේ වැඩේ හරියට කරනවා නම්, කිසිම ගැටළුවක් ඇති වෙන්නේ නැහැ. රනින් චාට් එකක් ලියන්නේ ඒකට මේ නිලධාරී මේසයක් මේසයක් ගානෙ හිටියට වැඩක් නැහැ. අපි ඔබතුමාගෙන් මේ සම්බන්ධව ප්‍රශ්නයක් ඇහුවාම, හරිනම් වෙන්න ඕන. අදාළ වාහනය සම්බන්ධ අදාළ නිලධාරියාගෙන් සියළු

තොරතුරු ලබාගන්න. ඒකට තර්ක නෙවෙයි ඉදිරිපත් කරන්න ඕන. ඔය කියන වාහනයට අදාළ රනින් චාට් ටික තමුන්නාන්සේගේ මේසෙ උඩට ගෙන්නලා බලන්න. ඩීසල් ගහපු දවස, ඒ මොහොත වන විට ඩීසල් ටැංකියෙ කොච්චර තියනවද කියල බලන්න. ටැංකිය පුල් ගහලා යවන්න. දුවලා ආවට පස්සෙ බලන්න. කොච්චර ධාවනය කරලද කියලා. එතකොට ලීටරයකින් දුවන්න පුළුවන් කිලෝමීටර් ගණන සොයා ගන්න පුළුවන්. තමුන්නාන්සේලා හැඩ ගස්සන්න කියන්නේ. මේකේ හොරකම් වෙනවා කියලා මම කියනවා.

ඊළඟ කාරණාව තමයි, කොම්පෝස්ට්, කොහොමද තත්ත්වය? අද පුලුවන්ද ඒ නිලධාරිය මෙතෙන්ට ගෙන්නලා අද දක්වා තියෙන පොහොර ස්ටොක් එක කියන්න. බැහැ. දුරකථන තියෙන්නෙ ඒවට. උප කාර්යාලයේ දුරකථනයක් තිබුණා. ස්ටොක් වුන ප්‍රමාණයයි, පැකට් ප්‍රමාණයයි වාර්තාව කියන්න. මෙහේ නිලධාරියෙක් ඉන්නවා. මෙහෙට ගෙන්න ගන්නවා කොම්පෝස්ට් එකේ වාර්තාව. මම ගිය සුමානේ කිව්වා සීයලා, මුණුපුරාලගෙ කතාව. ප්‍රතිඵලයක් තියෙනවද? මම කියපු කතාව ආරංචි වෙලා වෛර බැන්දා එක විතරයි වුණේ. මම අදත් කියනවා ඒ කතාව. ඒක නිසා නිෂ්පාදනය කොච්චර ද? සේවකයෝ කීදෙනාද වැඩ කරලා තියෙන්නේ, අලෙවිය කොපමණද කියලා කෑ ගැහුවට වැඩක් නැහැ. ලේකම්තුමියට පුළුවන් වෙන්න ඕන. නිලධාරියෙක් ගෙන්වලා සභාවේ කොම්පෝස්ට් එකේ විස්තර ලබාදෙන්න. අද අපට ස්ටොක් එක සම්බන්ධයෙන් කිසිම තොරතුරක් නැහැ. ඊළඟට අපි මෙතැනට මාසෙකට පස්සේ ඇවිල්ලා වාඩි වෙන්නේ. එහෙනම් හැකියාව තියෙන්න ඕන. ගිය මාස වාර්තාවෙන්, මේ මාසයේ අපට කොම්පෝස්ට් එකේ වාර්තාව ඉදිරිපත් කරන්න.

මම මේ ගරු සභාවේ අද යෝජනා කරනවා. සභාව තියෙන හැම වාරයකම කොම්පෝස්ට් පොහොර එකේ වාර්තාවක් මේ ගරු සභාවට ඉදිරිපත් කළ යුතුයි කියලා. දැන් ඉඩමක් සුද්ද කරා. කිසිකෙනෙක් දන්නවද දර යාර කීයක් කැපුවද කියලා. ලැබිච්ච ආදායම අපට කිව්වද? නෑ, අපි දන්නේ නැහැ. සල්ලි එන්න ඇති. දූෂණයක් සිදු නොවන්නත් ඇති. නමුත් හිත්වල කහට ඇති. ඒ කහට වලින් නිදහස් වෙන්න අවශ්‍ය නම්, දර යාර මෙච්චර කපල ඇති. මේවා කර්මාන්තශාලා වලට දීලා ඇති. අපට මෙච්චර ආදායමක් තියෙනවා කියලා කියන්න පුළුවන් වෙන්න ඕන. මේවා හැම දෙයක්ම බොහොම ලස්සනට, කැට් කරලා, කරගෙන යන්න පුළුවන් වැඩ. මේ සභාවේ අවුරුදු හතරක් මේ කොම්පෝස්ට් එකේ ආදායම, ගිය අවුරුද්දේ මෙච්චරයි කියලා තොරතුරු අපට ලබා දීල තියෙනවද? ආදායම අපට පෙන්වල දීල නැහැ. නමුත් අපට හයියක් එනවා. සභාවේ ආදායම මෙච්චරයි කියලා කියනකොට. ඒ වගේම තමයි. පොල් ආදායමත්, පොල් කඩනවා ද? පොල් කඩන්නෙ හොරු. නමුත් සභාවේ මුරකරුවන් ඉන්නවා. මම මේ ගරු සභාවට යෝජනා කරනවා. අපි මේ සභාවට ආවම ආසාවෙන් අහගෙන ඉඳීවි පොල් ආදායම් මෙච්චරයි. පොහොර ආදායම මෙච්චරයි. එහෙමනම්, අතිකාල සම්බන්ධව අපි කතා කරන්න යන්නෙ නැහැ. ඔබට විරුද්ධ ව කතා නොකරාවි. පොල් කැල්ල, පොහොර ගබඩාව හරියටම මුර කරල තියෙනවා. වාහන ටික හරියට මුර කරල තියෙනවා. තෙල් ටික හරියට ගහලා තියෙනවා. කිලෝමීටර් ගණන හරියට දුවලා තියෙනවා. මේකට පිරිසිදුයි කියන්න තමුන්නාන්සේ යන්න ඉස්සෙල්ලා අවස්ථාව අපට සලසලා දෙන්න කියලා, මම තමුන්නාන්සේගෙන් ඉල්ලා සිටිනවා. මම මීට වැඩිය කතා කරන්න යන්නේ නැහැ.

මේ කියපු සියලුම කරුණු චෝදනා නොවෙයි. ඔබතුමාට යෝජනා ඉදිරිපත් කළේ. මේ යෝජනාව ඉදිරිපත් කල 4 වෙනි අවුරුද්ද. මේ සභාපතිතුමත්, නිලධාරී මණ්ඩලයත්, එක්කෙනෙකුට හරි දඬුවම් දෙනවා නම්, අනිත් කට්ටියත් හරියාවි. ඊළඟ සභාව වෙනකොට පුංචි හරි වාර්තාවක්, අත්‍යවශ්‍ය දේවල් ටික විදිහට ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින්, මම නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රී අමර ධනංජය විලේ ගේ මහතා**

ගරු සභාපතිතුමා ඇතුළු සමස්ත සභාවෙන් අවසරයි. රටේ නිෂ්පාදන ආර්ථික ගැටලු තියෙනවා. සාමාන්‍ය ජන ජීවිතය වෙනස් වෙලා. මේ රට විකෘති තත්ත්වයකට පත්වෙච්ච කාලවකවානුවක්. ඔවුන් කියනවා පසුගිය 09 වැනිදා කළේ අරගලයක්ලු. මම හිතන්නේ අරගලයක් කියන එක ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරයා ඇතුළු මන්ත්‍රීවරුන් දැනගන්න ඕන. අරගල කළා. මාඕ සේතුන්, මහත්මා ගාන්ධි, චේ අරගලයක නායකත්වයක්, දර්ශනයක් මෙන්ම ප්‍රතිපත්තියක් තිබුණා. මාඕ සේතුන්ලා, චේ සමාජවාදය ප්‍රතිපත්තිය කරගත්ත, මහත්මා ගාන්ධි අවිහිංසාවාදය ප්‍රතිපත්තිය කරගත්තා. ඒවා ප්‍රතිපත්ති කරගෙන ඔවුන් යම්කිසි ඉලක්කයකට ගියා. ඒගොල්ලන්ට තිබුනා අරමුණක්. නමුත් අපි දැක්ක පහුගිය කාලේ ලංකාවේ ක්‍රියාත්මක වෙච්ච අරගලය, මේක කවුරු කොහොම හැඳින්වුවත්, ගෝල්ෆේස් ත්‍රස්තවාදයක්. ත්‍රස්තවාදය මොකක්ද කියලා මම දන්නේ නැහැ කිව්වට, ඔබතුමා තමයි ඒක දන්නේ නැත්තේ. ජනාධිපති මන්දිරය, අරලියගහ මන්දිරය, ජනාධිපති ලේකම් කාර්යාලය, බැසිල් රාජපක්ෂගෙවත්, රනිල් වික්‍රමසිංහගෙවත් නෙවෙයි. ඒවා රාජ්‍ය දේපල. ඒකට ඇතුළෙ ත්‍රස්තවාදී නෙවෙයි කියනවනම් අන්න ඒ කෙනා අද බාලයෙක්. රටේ ප්‍රධාන මරුමස්තානය වන ජනාධිපති කාර්යාලයේ ජනාධිපති පුටුවේ වාඩිවෙලා, ඒ විතරක් නෙවෙයි ජාතික රූපවාහිනියටත් ඇතුළුවෙලා, විකාශනය නවත්තලා, ඒ කට්ටියට ත්‍රස්තවාදීන් නෙවෙයි කියනවනම් අන්න ඒ කියන කෙනා අද බාලයෙක්.

ගරු සභාපතිතුමනි, මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය බිංදුවට දාලා තියෙන්නෙ. මම හිතන්නේ ප්‍රජාතන්ත්‍රවාදය අනෙක් කෙනාගේ නහය ගාවින් ඉවර වෙනවා කියලා කියන්නෙ. නමුත් අපි දැක්කා ප්‍රජාතන්ත්‍රවාදය ගැන කියනවනං, මේ අරගලය නිර්පාර්ශ්වික වුනත්, සර්වපාක්ෂික බවට පත්වෙලා තියෙනවා. අද අරගලය අල වෙන්න හේතුව රනිල් වික්‍රමසිංහ මහත්තයාවත්, ආණ්ඩුවවත් නෙවෙයි. ජනතා විමුක්ති පෙරමුණ, මේ අරගලය ඇතුළට තමන්ගේ ප්‍රශ්න ඇතුල් වුණා. ඒ නිසා අරගලය විනාශ වුණා. 1970 මේ රටේ අවුරුදු හැත්තෑ පහක දේශපාලනය කරපු බංකොලොත්ම දේශපාලන පක්ෂය තමයි ජනතා විමුක්ති පෙරමුණ. කවුරුහරි කියනවා නම් එහෙම නෙවෙයි කියලා, මම ඔප්පු කරල පෙන්නනවා. අවුරුදු 75ට කිසිම දෙයක් සිද්ධ වෙලා නැහැ කියලා කිව්වා. එහෙමනම්, මේ ඔෆිස් එක මෙහෙම පවත්වගෙන යන්න බැහැ. කිසිම දෙයක් සිද්ධ වෙන්නේ නැත්නම්. 1969 සපුගස්කන්ද තෙල් පිරිපහදුව හදනකොට, එවිට තිබුන වාහන ප්‍රමාණය සහ දැන් තියෙන වාහන ප්‍රමාණය බලනකොට, බංකොලොත්ම දේශපාලන පක්ෂය ජනතා විමුක්ති පෙරමුණ.

ගරු සභාපතිතුමනි, තව දෙයක් කියන්න ඕන. අද ගෑස් ටික ඇවිල්ලා තියෙනවා. පෝර ටික ආවෙ පසුගිය 9 ට ඉස්සෙල්ලා. පෝර ටික ඇවිල්ලා බෙදන්න ලෑස්ති වෙනකොට, ඊට කලින් මේ පිරිසට අවශ්‍ය වුණා. කොළඹට මිනිස්සු ටික ගෙනිහිල්ලා, ආණ්ඩුව පෙරලන්න. ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා විදිහට එක ලේ කඳුලක් හලන්නේ නැතුව, ඉවත් වෙලා ගියා. මම ඉතාමත්ම ගරු කරනවා ගෝඨාභය මහත්තයට ඕන වුණේ වෙනස්ම විදිහකට රටේ ආර්ථිකය හසුරවන්න. නමුත් රටේ ඉහළ නිලධාරීන් එතුමට ඕන විදිහට වෙනස් වුනේ නැහැ. එතුමට ඕන විදිහට හසුරුවා ගන්න ඕන කියන එක එතුමා බලාපොරොත්තු වුණේ නැහැ. මේ රටේ සිස්ටම් චේන්ජ් එකක් කරන්න ගියේ පළමුවෙන්ම ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා. system change කරන්න ගිහිල්ලා ඇනගත්තෙත් එතුමා. නමුත් මෙතුමා ජනතාවගේ ලේ කඳුළක් සොලවන්නේ නැතුව, ජනතාවට හානියක් නොකොට, එම ස්ථානයෙන් ඉවත් වීම පිළිබඳව, එතුමා ගැන ආඩම්බර වෙනවා. ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීතුමාත් කිව්වා. රනිල් වික්‍රමසිංහ මහත්තයා ආවේ අපි හින්දා කියලා. නමුත් මම දන්න විදිහට අපේ පක්ෂයෙන් ඉදිරිපත් කළේ ඩලස් අලහප්පෙරුම මහතා. එතුමා පැරදුනා. රනිල් වික්‍රමසිංහ මහතා ජනාධිපති වුණා. අපේ පරාජය අපි පිළිගන්නවා. මොකද රහස් ඡන්දයක්නෙ. රටේ රාජ්‍ය තන්ත්‍රය බින්දුවට වැටිච්චි අවස්ථාවේ, විමල් වීරවංශ මහත්තයා ඡන්ද දෙන්න ගිය අවස්ථාවේ කිව්වා, මේ රටේ පරිපාලනය බින්දුවට වැටිලා

තියෙන්නෙ කියලා. ජනතා විමුක්ති පෙරමුණේ සාමාජිකයෝ කියනවා. මම අධ්‍යනයක් කලා. ඔවුන් පීඩා විඳින මිනිස්සු. සමාජය ගැන වෛරයකින් ඉන්න පිරිසක් තමයි ජනතා විමුක්ති පෙරමුණේ සහ අන්තරේ කියන්නේ. අපේ ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීතුමා නම් එහෙම නැහැ. ඉතිහාසයේ ඉඳලම ජනතා විමුක්ති පෙරමුණ ගිනි අවුළුවපු එක තමයි කලේ.

අපි ඇත්තටම මේ ආර්ථික ප්‍රශ්නය ගැන කතා කළොත්, ගෝඨාභය මහත්තයා ජනාධිපති වෙලා හිටපු වසර දෙක තුළ ඇති වෙච්ච ප්‍රශ්නයක් නෙවෙයි. කොහොම නමුත් අරගලයෙ හිටපු මිනිස්සු, අපට කන්න දියව්, බොන්න දියව්, ගෑස් දියව්, පෙට්‍රල් දියව් කියලා බෝඩ් ඉස්සුවෙ නැහැ. කියපු එකම වැකිය තමයි gota go home කියලා. එතුමා වරද්ද ගත්තේ රුවන්වැලි මහා සෑය මළුවේ දිවුරුම් දෙන උත්සවයේදී කියනවා. මම සිංහල ඡන්දවලින් ආපු කෙනෙක් කියලා. ස්වාමිවරයෙක් කියනවා. පාස්කු ප්‍රහාරය කළේ ගෝඨාභය රාජපක්ෂ මහත්මයා කියලා. එවිට ක්‍රිස්තියානු රටවල් වලින් එන ආධාර ටිකත් නවතිනවා. මේ රටේ වෙළෙඳ ව්‍යාපාරය තියෙන්නේ, බහුතරය මුස්ලිම් හා දෙමළ අතේ. එවිට මේ ඩොලර් ටික ලේසියෙන්ම නවතිනවා. එවිට ජනතා විමුක්ති පෙරමුණ, අන්තරය, එතනින් එහාට ගියහම, මේ ඩයස්පෝරාව ඇතුළු සංවිධාන ටික, විශේෂයෙන්ම ජනතා විමුක්ති පෙරමුණ හා නීතිඥ සංගමයට ඇමරිකාවෙන් මුදල් එවනවා. පැහැදිලිවම නීතිඥ සංගමයේ සභාපතිවරයා පිළිඅරගෙන තියෙනවා. මිරිහානේදී වෙච්ච සිද්ධියේදී, අත්අඩංගුවට ගත්ත පුද්ගලයා අධිකරණය ඉස්සරහදි අත්පුඩි ගහලා පිළිගත්තේ. එළියට එනකොට ගිනිතියපු අය, මරපු අය වැරදිකාරයෝ, අත්පුඩි ගහලා පිළිඅරගෙන, මේ රටේ නීතියේ ආධිපත්‍ය අරගෙන ගියා යම්කිසි තැනකට. මම හිතන්නේ මේ මුදල් සම්බන්ධව කතා කරනවා නම්, වැඩිම වත්කමක් ඇති පිරිස බවට පත්වෙලා තියෙන්නේ ජනතා විමුක්ති පෙරමුණ. NGO හරහා එන මුදල් ජනතා විමුක්ති පෙරමුණ පොම්ප කරමින් සිටිනවා.

මේක අරගලයක් නෙවෙයි. ගෝල්පේස් ත්‍රස්තවාදය. මේ අරගලය රාජ්‍ය පාලනය පෙල්ලලා දාලා ඔවුන් බලාපොරොත්තු වුණේ රාජ්‍ය තන්ත්‍රය. ජනතා විමුක්ති පෙරමුණේ ඉන්න මානසික ලෙඩ්ඩු ටික තමයි මේ වන විට මෙරට පාලනය කරන්නේ.

නමුත් යම්කිසි වාසනාවකට රට ස්ථාවර වෙමින් පවතිනවා. හේතුව තමයි ඩොලර් එක ස්ථාවර වුණා. පාර්ලිමේන්තුව ස්ථාවර වීමත් එක්ක, දේශපාලනය ස්ථාවර වෙනකොට, මේ රටේ ව්‍යාපාරිකයෝ ස්ථාවරයි. රනිල් වික්‍රමසිංහ මහත්තයා තාම වැඩ පෙන්නන්න පටන් ගත්තේ නැහැ. මේ තියෙන්නෙ මන්ත්‍රීවරුනි, බැසිල් රාජපක්ෂ මහත්තයා ඉන්දියාවෙන් ගෙනා ඩොලර් ටික, මේ ගෙනාපු බඩු ටික ගෙනාවෙත් ඒ ඩොලර්වලින්. දැන් ඉදිරියේදී 2024 වෙනකන්, අපේ ගරු මන්ත්‍රීවරුන්ගේ ගෞරවය ආරක්ෂා කිරීම සම්බන්ධව කතා කරනවා. අපි අද පොලීසියට ගියත්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගියත්, මන්ත්‍රීවරු විදියට කිසි දෙයක් කරන්න බැරි, කිසිම වැඩකට නැති පිරිසක් විදිහට තමයි හුවා දක්වන්නේ. ඒ වගේම අද මම මේ සභාවේ පළමු සභා වාරයට පැමිණි දවසෙ වගේ තමයි මට හැඟෙන්නේ. මෙහෙම කරන්න. ෆොටෝ ටික ගහන්න කියනවා. ලබන සභාවාරයේ සිටවත් සභාපතිතුමා, යම්කිසි පාලනයක් ඇතිව වැඩ කටයුතු ටික කරන්න. නිලධාරී හරියට ක්‍රියාත්මක කරවන්න. අධිකරණ නියෝග ගන්න බැරි ඒවා දැන් ගන්නවා. ඇයි ගෝඨාභය මහත්තයට බැරි වුණේ මේවා පාලනය කරන්න, මර්දනය කරන්න. දැන් පාර්ලිමේන්තුවේ නියම ගෞරවය ලැබිලා තියෙනවා. බැරිනම් යන්න ඕන. පොලිසියට ගහන්න ගියාම පොලීසියෙන් වෙඩිතියලා. ඇත්තටම ගෝඨාභය මහත්තයට 2/3 බලයක් හා 69 ලක්ෂයක් ඡන්දය දීලා, ක්‍රියාත්මක කරන්න බැරි වුනේ. ඒ වගේ තමයි ඔබතුමාටනේ මේ සභාවෙ විධායක බලතල තියෙන්නෙ. ඇයි ඔබතුමාට ඒවා ක්‍රියාත්මක කරන්න බැරි. අඩුම ගානෙ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙක් කිව්වම, මේ ඇඳුම ඇඳගෙන යම් තැනකට යන්න ඉඩ දෙන්න. අපට කොහොම වුණත් රනිල් වික්‍රමසිංහ මහත්තයා හොඳ දේශපාලන නායකයෙක් කියන්න පුළුවන්. හැබැයි මහින්ද රාජපක්ෂ ඇරුණහම. ඒ වගේම ගෝඨාභය මහත්තයා ගැනත් අපි සතුටු වෙනවා. කිසිම ලේ වැගිරීමකින් තොරව අයින් වීම සම්බන්ධව. ඒ වගේම මේ අරගල කරලා

ආණ්ඩු හදන්න පුලුවන්නම්, අපි ඡන්දය ඉල්ලුවට වැඩක් නැහැ කොහොම නමුත් අරගලයෙන් පස්සෙ ඇතිකරපු ජනාධිපතිවරයා පිළිගත්ත විදිහට, ජනතා විමුක්ති පෙරමුණේ ජනාධිපතිවරයා මේ වෙනකොට ත්‍රස්තවාදය වපුරපු අය, අත්අඩංගුවට පත් කරමින්, නීතියේ ආධිපත්‍ය ඇති කරමින්, ඉන්නවා. ඒ පිළිබඳව ජනතා විමුක්ති පෙරමුණට සුබ පතමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා**

ගරු සභාපතිතුමා ඇතුළු සමස්ත සභාවෙන් අවසරයි. 2018 ප්‍රාදේශීය සභාවට පත්වෙච්චි දවසේ ඉඳලා, මේ වෙනකොට අවුරුදු හතරක් ඉවරවෙලා. කොහොම වුණත් කමක් නැහැ. මම කියන්නේ අපි ඉදිරියේදීවත් මේ කෙටි කාලය තුළදී හරි ප්‍රදේශයේ ජනතාවට මේකෙන් ලැබෙන දෙයක් ලබාගන්න, යම් නීත්‍යානුකූල ක්‍රමවේදයක් තුළ සිද්ධ කරන්න, යම් වැඩ පිළිවෙලක් හැදුවොත් හොඳයි කියන එක මම හිතන්නේ. මොකද 2006 ප්‍රාදේශීය සභාවට එනවිට තිබුණ තත්ත්වය නෙවෙයි අද තියෙන්නේ. නමුත් ඒ තිබෙන සම්පත් ටික, ඒ තියෙන දේවල් ටික ඒ විදියම තමයි. නමුත් මිනිස්සුන්ගේ ආකල්ප හොඳ තත්වයෙන් පිරිසිදුව තිබුනත්, මේ වන විට ඒ ආකල්පය ගිලිහිලා ගිහිල්ලා. ඒ නිසා සභාපතිතුමාට මේ වෙලාවේ අපි අවධාරණය කරනවා. ඉදිරියේදීවත් මේ ප්‍රාදේශීය සභාවට යම් දෙයක් කරන්නට න,ම් ඔබතුමා කවුරු ගැනවත් විශ්වාස නොකොට, හැමදේටම ඉදිරිපත් වෙන්න ඕන කියලා මම විශ්වාස කරනවා. නැත්නම් ඉදිරියේදී කරගෙන යන්න බැරි වෙනවා. ඒ නිසා ඔබතුමා හැමදේටම නිරන්තරයෙන් කාලය යොදවලා, මේ කටයුතු කරන්න සිදුවෙනවා. මම හිතන්නේ ලේකම්තුමියටත් මේ සම්බන්ධව ඉටුකරන්න ලොකු කාර්යභාරයක් තියෙනවා. මම කාටවත් දොස් කියන්නේ නැහැ. ඇත්තටම මෙතන කැපවෙලා සේවය කරන සේවක පිරිසකුත් ඉන්නවා. සමස්තයක් ලෙස ගත්තම, 2018 ඉඳලා මේ දක්වා කාර්ය මණ්ඩල සඳහා ගෙවීම් කිසිම ලෙසකින් අඩු කරලා නැහැ. ඒ වගේම ප්‍රදේශයට වන සේවාවන් පිළිබඳව මම හිතන්නේ, අපේ මන්ත්‍රීවරුන් මේ බල ප්‍රදේශයේ කාටවත් අපි දොස් කියල හරියන්නෙ නැහැ. නමුත් අපි මේක නිවැරදිව ගොනු කරගන්න ඕන. මේ වෙලාවේ සියලු දෙනා කැපවෙන්න ඕන කියන එක මම සිහිපත් කරනවා. මොකද ප්‍රාදේශීය සභාව කිව්වම මේකෙ පැවරෙන රාජකාරි මොනවද කියලා සමහර නිලධාරීන් දන්නෙ නැහැ. ඒ වගේම දකිනවා. මේකෙ නිවැරදි මාවතක මේ නිලධාරීන් ගමන් කරන්නේ නැහැ කියලා. ඇත්තටම මම අනෙක් මන්ත්‍රීවරුන්ට වඩා, මේ සභාවට ඇවිල්ලා යනවා. පැමිණීමේ ලේඛනයේ පවා අඩුපාඩු තියෙනවා. මේකෙ කටයුතු යාවත්කාලීන නොකර, කටයුතු කළොත්, මේ අහිංසක සේවකයන්ට අපි හිතන්නේ දොස් පවරලා හරියන්නේ නැහැ. මේකෙ නායකත්වයෙ වරදක් තියෙන්නෙ. ඒ නිසා මම හිතන්නේ, මේ ලේකම්තුමිය වගේම, ඉන්න ප්‍රධාන කළමනාකාරතුමිය ඇතුළු සේවක මණ්ඩලය මේකෙ යම් කාර්ය පටිපාටියක් ක්‍රියාත්මක නොකළොත්, නිවැරදි පටිපාටියකට මේ සභාව ගන්න හම්බ වෙන්නේ නැහැ. ඒ නිසා මේකෙ පාලනය නිලධාරීන්ගෙන් සහ සභාපතිතුමා ඇතුළු කාර්ය මණ්ඩලයෙන් හා මන්ත්‍රී මණ්ඩලයෙන් ගිලිහිලා තියෙනවා කියන එක කියන්න පුළුවන්. මේකෙ පාර වැඩ කරන කම්කරු මහත්තයාගේ ඉඳලා තීන්දු තීරණ ගන්න තත්ත්වය උදාවෙලා තියෙනවා. මට ජාතික දේශපාලනය හෙන ගැහිල ගියත්, අපි නියෝජනය කරන මේ සභාව තුළින් මේක නිවැරදි කරගන්න ඕන. ඉතා ඉක්මනින් මහ ආණ්ඩුව සර්වපාක්ෂික ආණ්ඩුවක් පිහිටුවන්න යනවා. නමුත් අපේ ප්‍රාදේශීය සභාවේ පක්ෂ විපක්ෂ භේද නැහැ. ඉතින් ඒක නිසා මේ සභාව තුළ, මේ මන්ත්‍රීවරු විසිහත් දෙනාටම වගකීමක් තියෙනවා. අද දවසේ ප්‍රාදේශීය සභා රැස්වීමට ඇවිල්ලා, මෙතන වාඩිවෙලා, පුළුවන් තරම් මෙතන කතා කරලා, එහෙම ගිහිල්ලා වැඩක් නැහැ. මේ කාලයේදී අපට මෙතනට, රටට, ගමට වැඩ කරන්න බැරි නම්, මෙතන ඇවිල්ලා මොනවද වෙන්නේ. මෙතන සේවකයන්ට මම දොස් කියන්නේ නැහැ. මෙම සේවකයන්ට නිවැරදි නායකත්වයක් නැතිකම තියෙන්නෙ. මේ සභාවට මම යෝජනා කරනවා. මේ ලේකම්තුමිය ඇතුළු නිලධාරීන්ගේ යම් අඩුපාඩුවක් තියෙනවා නම්, ඒවා පෙන්වලා දීලා

කටයුතු කරන්න කියලා. ඒ වගේම මම දකිනවා සේවක අත්සන් පොතේ ඉඳලම විධිමත් භාවයක් නැහැ. නිවැරදි ලිපිගොනු මේ සභාව තුළ සොයා ගන්න ලැබෙන්නේ නැහැ. ඒවා ඉස්සර ඉඳලම ආපු දේවල්. අපිට තියෙන වත්කම් සම්බන්ධයෙන්, ඉඩම් සම්බන්ධයෙන්, මේ සභාව තුල නිවැරදිව ලේඛනගත වෙන්නෙ නැහැ. මම දකිනවා අලුත් දරුවෝ විශාල පිරිසක් විශ්ව විද්‍යාල අධ්‍යාපනය ලබලා, ඒ ළමයි රාජ්‍ය සේවයට, අලුතින් එක් වෙච්ච ජවසම්පන්න කණ්ඩායමක් මෙතන ඉන්නවා. මේ නිලධාරීන්ට යම් කටයුත්තක් හරියාකාරව පැවරුවොත් කරයි කියලා විශ්වාසයකුත් තියෙනවා. මම විශ්වාස කරනවා, අපි මොනවා කරන්න කලිනුත් මේ සභාව නිවැරදි කරන්න වෙනවා.

අපේ සහබන්දු මන්ත්‍රීතුමා කිව්වා. මට ලැජ්ජත් හිතෙනවා. මොකද අපේ සභාව සතු මාර්ග කැලේ වැවිලා, යන්නත් බැරි තත්ත්වයට පත්වෙලා කියලා. ඒක ඇත්ත. ගරු සභාපතිතුමාත් කියන එක ඇත්ත. කම්කරුවෝ 2-3 යි ඉන්නේ. ඒ අයගෙනුත් වැඩ ගන්න එක බොහොම අසීරු තත්වයක් වෙලා තියෙන්නෙ. මේ මන්ත්‍රීවරු 27 එකතු කරගෙන, අපේ නිලධාරී ටිකත් එකතු කරගෙන, අපි ගමට ගිහිල්ලා, එක මාසයකට වරක් හෝ සතියකට වරක් හෝ ඔය නාස්තිවෙන දින ටික, මේ නිලධාරී කැමති වේවි ගමට ගිහිල්ලා විවිධත්වයක් කරන්න. ශ්‍රමදානයක් කරලා, මේ මන්ත්‍රීවරු විසි හත් දෙනාම එන්න කැමති වෙයි. අපට සල්ලි අවශ්‍ය වෙන්නේ නැහැ. මේ ගමේ තියෙන පාරවල් ටික සුද්ද කරගන්න.

ඒවගේම අද කතා කරනවා අරගල ගැන. නමුත් හැම මිනිහම හිතන්නේ තමන් ගැන විතරයි පාරේ මඩ වලක් තිබුනත් ගෙදර ඉදිරියේ කුණු ගොඩක් ගහලා තිබුනත් ඒක සුද්ද කරන්නේ නැහැ ්‍රාදේශීය සභා වෙනකම් බලාගෙන ඉන්නවා සුද්ද කරන්න ඒ නිසා මේ පුරවැසියන්ගෙන් වෙන්න ඕන යුතුකම් කොටස ඉෂ්ට නොවෙන නිසා තමයි අපි අද මේ තත්වයට වැටිලා තියෙන්නේ අපි අපිම ගහ මරාගෙන මේ සියලු දෙනාම කටයුතු කරන්නේ ිසිම අවබෝධයක් නැතිව තමයි සියලු දෙනාම කටයුතු කරන්නේ මම හිතනවා මේ ප්‍රාදේශීය සභාව හොඳ ප්‍රාදේශීය සභාවක් බවට පත් වෙලා මම විශ්වාස කරනවා ගරු සභාපතිතුමනි ඔබතුමා කීර්තිමත් ඒ වගේම ාවල ප්‍රදේශයේ මං සත්කාර පවුලක කෙනෙක් හැටියට ඔබතුමාගේ නම ඒ දේවල් ඉදිරියට ගෙනියන්න ඔබට තව අවුරුදු දෙකක් අවස්ථාවක් අවස්ථාවක් ස්වර්ණමය අවස්ථාවක් ලැබිලා තියෙනවා ඔබතුමා ඉතා කැපවීමෙන් මේ සම්බන්ධව කටයුතු කරන්න ඔබතුමාට අපි දෙන්න පුළුවන් හයිය දෙනවා මේ සමාව නිවැරදි මාවතකට ගමන් කරවන්න කියන ඉල්ලීම මම ඔබතුමාගෙන් පළමුවෙන්ම ඉල්ලා සිටිනවා මොනව වුණත් අපට ලැබිච්ච අවසාන අවස්ථාව මේක මේ නිලධාරී දිග නිවැරදි මාවතකට යොමු කරන්න කියන ඉල්ලීම කරනවා.

ඒ වගේම අපේ සභාවට එන ආදායම් සියල්ල වැහිල තියෙන්නෙ. අද රුපියල් 5000 -6000 ක් තත්ත්වයට පත්වෙලා. ආදායම් ලබාගන්න මාර්ග පාදගන්න අපට අවස්ථාව තියෙනවා. මේකත් පුංචි ආණ්ඩුවක් වගේ තමයි. මෙහි බලය සභාපතිවරයාට තියෙන්නෙ. නීතිරීති ගෙනැල්ලා, ඒවා කෙටුම්පත් කරලා, ගැසට් කරලා, අපට පුළුවන් නාගොඩ ප්‍රාදේශීය සභාවට පමණක් අනන්‍ය වූ නීති ප්‍රමාණයක් හදලා, අපට මුදල් උපයා ගන්න. ගල්කොරි වලින්, ගඟෙන් වැලි ගොඩ දානවා. කෝටි තුන හතර හම්බ කරල තියෙනවා. නමුත් සභාවට එක රුපියලක්වත් හම්බ වෙලා නැහැ. නව නීති හදාගන්න අපට අවස්ථාවක් තියෙනවා. ඒ නීති හදාගෙන, පළාත් පාලන දෙපාර්තමේන්තුවටත් යවලා, ඊට පස්සේ අපට පුළුවන්කම තියෙනවා ගැසට් මගින් ප්‍රකාශයට පත්කරලා, ඒවා ක්‍රියාත්මක කරන්න. එවිට නීතිය අපට උපරිමෙන්ම තියෙනවා. මම හිතන්නේ මේ නිලධාරීන් මේවට උනන්දු වෙලා, පරිශීලනය කරලා බලලා, පසුගිය අණපනත්, බලය, ආර්ථිකය ශක්තිමත් කරගන්න කියන ඉල්ලීම මම මේ වෙලාවේ කරනවා. ගරු සභාපතිතුමා, උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයට වගකීමක් තියෙනවා. අපිට කරන්න පුළුවන් මොකක්ද කියල හිතන එක. නැතුව තේ ටිකක් බීලා, මෙතන ඉන්න නිලධාරීන්ට අවලාද කරලා, මෙහෙම යන්න නෙවෙයි බලාපොරොත්තුව. මම මේ ප්‍රාදේශීය සභාවේ කිසි කෙනෙකුට අගෞරව

කරන්න නෙවෙයි බලාපොරොත්තුව. අපි සියලු දෙනාම නිවැරදි මාවතකට යොමු කරවගෙන මේ ප්‍රදේශයේ තියෙන හොඳම ආයතනයක් බවට පත්වෙන එක තමයි මගේ බලාපොරොත්තුව හා කැමැත්ත. මොකද අද ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගියහම, ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු සත පහකට ගනන් ගන්නේ නැති තත්ත්වයකට පත් වෙලා තියෙන්නෙ. නිකන් වෙලාවක ඇවිල්ලා බලන්න. මෙතනට ආවත්, මෙතනත් එහෙම තමයි. අනතුරුදායක ගස් ඉවත් කිරීමේ බලය තියෙන්නෙ සභාපතිතුමාට. මේකේ මොන නීති ආවත් මොන දේ වුණත්, එතුමට පුළුවන්කම තියෙනවා ඕනම දෙයක් කරන්න. සමහර අවස්ථාවේදී මේ සභාවේ කටයුතුවලට අධිකරණයට යන්න වුණොත්, ඒ සඳහා අණපනත් ගැසට් කරලා, සම්මත කරලා තිබුනොතින් අපට අවස්ථාව තියෙනවා. මම මීට ඉස්සරත් කිව්වා. නාගොඩ ප්‍රාදේශීය සභාවට අයත් පාරවල් ටික ගැසට් කරන්න අවශ්‍ය කටයුතු කරන්න, මූලික කටයුතු කරමු කියලා. නමුත් ඒ කටයුතු ගැන කතා කරලා, අවුරුදු 1කුත් ඉකුත් වෙලා, ඒ කටයුත්තක් කරගන්න බැරිවෙලා තියෙනවා. ඒ නිසා මම ගරු සභාපතිතුමාට යෝජනා කරනවා. මේ නිලධාරීන් කිහිප දෙනෙක් සහ මන්ත්‍රීවරු කිහිප දෙනෙක් එකතු කරලා කමිටුවක් හදන්න. හැම මාර්ගයක්ම ප්‍රාදේශීය සභාවට අයිතියි කියනවා. නමුත් අධිකරණ ක්‍රියාමාර්ගයකට මේ වගේ කතා කියල හරියන්නෙ නැහැ. ලිඛිතව ගැසට් කරලා කියන්න ඕන. මේ පාරවල් අපට තියෙනවා කියලා. යටලමත්ත, නාගොඩ ගම් සභාව තියෙන කාලයේ ගැසට් කළාට පස්සෙ එකක් දෙකක් ඇරෙන්න ගැස්ට් කරලා නැහැ.

ඒ වගේම ඉතා කණගාටුයි සභාපතිතුමනි, මේ සභාවෙ හැමතැනම සභාවල්. මේ සභාවට නිවැරදි නායකත්වයක් දෙන්න ඕන. මේ සභාවේ ගෞරවය සම්බන්ධයෙන් හැමෝටම වගකීමක් තියෙනවා. ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු හැටියට මොකද්ද කරන්නෙ කියන එක සම්බන්ධව. තේ වතුර බීලා, කාටවත් අවලාද කරලා යන එක නෙවෙයි. අපට මාසයක් පුරාවට, මන්ත්‍රීවරයා හැටියට, වෙන රාජකාරි කරන මනුස්සයෙකුට වගේ ඇඹිල්ල තියලා ගියහම හතරට වැඩ ඉවරයි. නමුත් මහජන නියෝජිතයන් කියන්නේ පැය 24 පුරාම ජනතාව වෙනුවෙන් කැප වෙලා වැඩ කටයුතු කරන කෙනෙක්. ඒ පිළිබඳව අපි විශ්වාසය තියන්න ඕන. ඇත්තටම ඒ පිළිබඳව මම කණගාටු වෙනවා. ඇත්තටම විධිමත් සභාවක් නෙවෙයි. මේ සභාවේ එකම විධිමත් බවක් තියෙන්නේ, ජ්‍යේෂ්ඨත්වය අනුව වාඩි වෙන එක විතරයි. මොකද න්‍යායපත්‍රානුකූලව නියමාකාරයෙන් මේ සභාවේ කටයුතු කෙරෙනවා නම්, මෙච්චර වෙලාවක් මේ සභාව ඇදෙන්න විදියක් නැහැ. මම මතක් කරනවා ඔබ සියලු දෙනාටම. පළාත් පාලන පනත වගේම, සභා රීතිත් ලැබිලා තියෙනවා. කොයි වෙලාවේ හරි රීති ප්‍රශ්නයක් හරි නිර්මාණය කරන්න, ඒක ඉගෙනගෙන එන්න ඕන. ඒ නිසා මම මතක් කරනවා මේ වෙලාවෙදි. අපි හැමදෙනාටම ලොකු වගකීමක් තියෙනවා. මේ වගකීම ගිලිහී ගිය නිසා තමයි ශ්‍රී ලංකාව වැනි රටකට අද මේ වගේ ප්‍රශ්නයකට මුහුණ දෙන්න වෙලා තියෙන්නෙ. ඒ නිසා මතක තියාගන්න. තමන් ගැන විතරයි හිතන්නේ. කොච්චර අපි මේ ගැන කිව්වත් වැඩක් නැහැ. තමන් ගැන හිතන එක නැති කරගන්නේ නැතිතාක්, අපේ දරුවන්ටත් අපි කියල දෙන්නේ තමන් ගැන හිතන එක විතරයි.

අපට ලොකු සංගායනාවක් කරන්න වෙනවා. ඉදිරියේදී මේ තත්ත්වයෙන් මිදෙන්න නම් මතක තියාගන්න, අද මේ කතා කරන දේවල් වෙන්නේ නැත්නම්, හෙට දවසෙත් මේ දේවල් සම්බන්ධව කතා කරනවා. ප්‍රාදේශීය සභාවෙ සියලුම නිලධාරීන්ට විනයක් අවශ්‍ය වෙනවා. මම ඉල්ලීමක් කරනවා ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු ටිකයි, නිලධාරී ටිකයි ගමට ගිහිල්ලා, යම් සේවාවක් කරන්න කියලා. එදාට අපට පුළුවන් වෙයි ගොඩක් දේවල් එකවර කරන්න. ලයිට් හදන්න හැමදාම යන්න ඕන නැහැ. ඒ යන දවසට ලයිට් වැඩ කටයුතු කරන්න පුළුවන් වේවි. අනවසර ගස් තියෙනවා නම්, සභාපතිතුමාට, ලේකම්තුමියට, පරිසර නිලධාරීට ගිහිල්ලා, ඒ අවශ්‍ය කටයුතු කන්නෙ නැත්නම්, මුදල් නැතිව, සත පහක් නැතුව, මේ දේවල් කරන්න පුළුවන් කම තියෙනවා. මෙතන ඉන්න නිලධාරීන් සහ මන්ත්‍රීවරුන් නයි මුගටි වගේ. මතක තියාගන්න. ඒ නිසා මේ

නිලධාරීන් හා මන්ත්‍රීවරුන් සහයෝගයක් ඇතිකරලා, මේ දේවල් කරන්න ඕන කියන එක මම බලාපොරොත්තු වෙනවා.

දීර්ඝ වශයෙන් මම කතා කරන්න නොහිටියත්, මේ දේවල් ටික සඳහන් කරන්න ඕන කියලා මම හිතනවා. විශේෂයෙන් මේ නිලධාරි පාලනය කිරීමේ බලය තියෙන්නේ ලේකම්තුමිය වශයෙන් ඔබතුමියට. මේ අත්සන් කරන පොතක් තියෙනවා. ඒකෙ මේ සේවකයන්ට ෆින්ගර් මැෂින් එක වැඩ නැත්නම්, අත්සන් ලේඛනයක් තියෙනවා. ඒකේ හැම නිලධාරියෙකුටම අංකයක් තියෙනවා. ඒ අංකය ඉදිරියෙන් අත්සන් කරලා, වෙලාව දාලා, වෙලාව පහුවුනාම රතු ඉර ගහනවා. පහුවෙලා එන නිලධාරීන් ඊට යටින් අත්සන් කරලා, එදා නොපැමිණි නිලධාරින්ගේ නම් ටික රතුපාටින් යටින් ලියලා කටයුතු කරන්න. මේ සම්බන්ධව වෙන අක්‍රමිකතා නිවැරදි කරගන්න. මේ දේවල් වලට ඔබතුමා කටයුතු කරන්නෙ නැත්නම්, මන්ත්‍රී කණ්ඩායමක් ලෙස අප එකතු වෙලා හරි, මේ දේවල් කරනවා කියලා කියනවා. ඒ වගේම අපේ ගරු සභාපතිතුමාට මේ කාර්යයන් ඉදිරි වසර දෙක තුළ කරන්න හැකියාව ලැබෙන්න කියලා ආශිර්වාද කරමින්, සියලු දෙනාට සුබ අනාගතයක් පතමින්, මම නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රී සමන් නාපේ විතානගේ මහතා**

සභාපතිතුමා ඇතුළු ලේකම්තුමිය ප්‍රමුඛ සියලු දෙනාගෙන් අවසරයි. සභාපතිතුමනි වැඩි වෙලාවක් ගන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. මේ දවස් වල වීදි ලාම්පු සවිකිරීම, ඒ වගේම පාර සුද්ද කිරීම් කෙරුණ ද කියලා අහන්න කැමතියි. ඒ වගේම ඔබතුමාට මම දැනුවත් වීම් කලා. උඩුගම පොලේ වහලෙ තහඩුවක් සුළගට යෑම සම්බන්ධව. ඒවා සොයා බලා කටයුතු කළාද කියන එක ගැනත් ප්‍රශ්නයක් තියෙනවා. ඇත්තටම සභාපතිතුමනි, අපි මෙතනට ආපු වෙලාවට, මට නිරතුරුවම ඇසෙන්න ලැබෙනවා. කොයි වෙලාවෙත් නිලධාරීන්ට බනිනවා. ඇත්තටම ඔබතුමාගේ දුර්වලකම නිසා තමයි, ඒ නිලධාරීනුත් බැනුම් අහන්නේ. නැත්නම් මේ සභාවේ දක්ෂ නිලධාරීන් පිරිසක් ඉන්නවා. දක්ෂ ලේකම්තුමියක් ඉන්නවා. ඔබතුමා සොයා බලන්නෙ නැතිකම තමයි මීට ප්‍රධාන හේතුව. විපක්ෂය ගත්තම, ඒ සියලුම සියලු දෙනාම කතා කරන විට අපට අහන්න ආසයි. මොකද හිටපු ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරුන්. අපේ අඩුපාඩු ඇති. අපි ඒවා ඔබතුමාලගෙන් අහලා දැනගන්න කැමතියි. අවුරුදු දහයක් ඔබතුමා සභාපතිකමේ හිටියත් වැඩක් නැහැ. සභාව මෙහෙම යනවා නම්. ඔබතුමා, අපේ සහබන්දු සභාපතිතුමාලා, අජිත් මන්ත්‍රීතුමාලා දෙන උපදෙස් ක්‍රියාත්මක කරන්නෙ නැත්නම් හරි, මම හොයා බලන්නම්. මම නිලධාරියෙක් පත් කරලා ඉන්නේ කියලා අත පිහදාගන්න හදනවා නම්, ඔතන ඉඳගෙන ඔබතුමා ප්‍රතිචාර දක්වනවා නම්, හොයා බලන්නේ නැතුව, ඔබතුමා අවුරුදු දහයක් හිටියත්, මේ සභාව එන්න එන්න විනාශ වෙනවා. අපි මෙතන ඉඳීවි. ඔබතුමා ඔයා පුටුවෙන් බැහැල යාවි. නමුත් ඉදිරියේදී අපට තියෙන සම්පතක් තමයි නාගොඩ සභාව. මේකට කවුරු පත්වේද කියලා අපි දන්නේ නැහැ. නමුත් ඔබතුමාගේ ගරුත්වය රැකෙන විදිහට කටයුතු කරන්න ඕන. ගෝඨාභය රාජපක්ෂ මැතිතුමත් කරගත්තේ ඔය ටිකමයි. දක්ෂ හිටපු ජනාධිපතිවරයෙක්. නමුත් බලය තියෙද්දිත් ඔලුව පහත් කරගෙන හිටියා. දැන් මොකද වෙලා තියෙන්නේ. රනිල් මහත්තයා ආවා විතරයි අරගලය ඉවරවුණා. රනිල් මහත්තයා අරගලය ඉවර කරන්න දක්ෂ වුණා. 69 ලක්ෂයක් ජනවරම ලැබිච්ච, හිටපු ජනාධිපතිතුමාට මොකද්ද වුනේ. ඒ වගේම ඔබතුමාටත් බලයක් තියෙනවා. ඔබතුමාට ගන්න තියෙන ලොකුම පාඩම රනිල් මහත්තයා. තව අවුරුදු දෙකක් දීර්ඝ කළොත්, ඒ දීර්ඝ කළ කාලෙදිවත් ඔබතුමා මේ සභාවට යම් දෙයක් කරන්නේ නැත්නම්, ගරු සභාපතිතුමනි සමාවෙන්න මෙහෙම කිවුවට. අපට උප සභාපති කෙනෙක් ඉන්නවා. හිටපු සභාපතිවරුන් ඉන්නවා. ඔබතුමා හරියට වැඩ කරන්නෙ නැත්නම්, මේ නිලධාරී හැමදාම බැනුම් අහනවා. වැරදි කරන නිලධාරීන් ඇති. එම නිලධාරීන් හදන්න, ඔබතුමාට බැරිනම්, මේ හිටපු කෙනෙකුට හරි දුන්න නම්, ඉදිරි කාලය තුළ මේ සභාව හොඳට තැනකට ගෙන ඒවි. නැත්නම් කොතනකට ගියත් ගණන් ගන්නෙ නැති කෙනෙක් බවට පත් වේවි. අනෙක් සභාපති වරු ඉන්න කොට අපි පොඩියි.

නමුත් සභාපතිවරයෙක් දැක්කම, මිනිස්සු පුදුම තරම් ගෞරවයක් දැක්වූවා. මේ අවුරුදු හතර තුළ, ඉහල නායකයින් වගේම, නාගොඩ සභාවේ සභාපතිවරයන්, ඒක නැති කරලා ඉවරයි. ඔබතුමාට මම ගරු කරනවා. හිත රිදුන නම් සමාවෙන්න. නමුත් ඔබතුමා නායකයෙක් විදිහට සභාපති විදිහට නුසුදුසුයි කියලා අපි කියනවා. මනුස්සකමයි, සිනහවයි විතරක් තියාගෙන වැඩ කරන්න බැහැ. නාගොඩ සභාවේ සභාපති විදිහට, අපේ ධනංජය මන්ත්‍රීතුමාත් ප්‍රකාශ කල පරිදි, ඔබතුමාට මෙච්චර බලයක් තියෙද්දි, ඔබතුමා එ්වා ක්‍රියාත්මක කරන්නේ නැහැ. අපි ගිහිල්ලා කරන ඉල්ලීමක්වත්, ඔබතුමා  නිහතමානව කරගන්න යන්නේ නැහැ. ඒක තමයි කණගාටුවට කාරණාව. ඔබතුමාගෙන් මම ඉල්ලනවා, මේ දක්ෂ ලේකම්වරියක් පත්වෙලා ඉන්නවා. දක්ෂ නිලධාරීන් ඉන්නවා. ඒ අයත් එක්ක එකතු වෙලා හොඳ වැඩපිළිවෙළක් හදාගන්න. ඒ වැඩපිළිවෙළ හදාගන්න තාක්කල්, ඔබතුමා ඒවා බෝලේ පාස් කරන්නේ නිලධාරීන්ට. සේවකයන්ට. මේ මන්ත්‍රීවරුන්ට තමයි ඒ නිලධාරීන් වෛර කරන්නේ. අපි සභාව ඉවරවෙලා, කතා කරලා යන විට, අපේ පස්සෙන් නිලධාරීන් එනවා ඒවට වගකියන්න ඕනත් ඔබතුමාම තමයි. වෙන කවුරුත් නෙවෙයි ඔබතුමා තමයි වගකියන්න ඕන. ලේකම්තුමියත් නෙවෙයි. ලේකම්තුමියටත් රාජකාරියක් තියෙනවා. නමුත් ඔබතුමා තමයි මේකෙ ලොකු තැන ඉන්නේ. මෙතැනින් වාහනයක් දැම්මනම්, ඉතින් ඔබතුමාට අහන්න පුළුවන්, ඒකට කීයක් යනවද? කවදද මේක දෙන්නේ? මොකක්ද මේකට වෙන්නේ කියලා. එහෙම හොයන්නෙත් නැතුව, ඒ දේවල් විතරක් කරලා වැඩක් නැහැ. සමාවෙන්න මෙහෙම කිවුවට. අපේ දේවල් කරාවි. නමුත් ගරු සභාපතිතුමනි, සභාවේ ගරුත්වයක් රැකගන්න කියන ගෞරවය ඉල්ලීම කරමින්, ඔබ සියලු දෙනාට ස්තූතිය පුදකරන ගමන්ම, ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීතුමාගෙන් සහ වනමල් මන්ත්‍රීතුමාගෙන් ඉල්ලීමක් කරන්නේ, මේ වෙලාවේ පක්ෂ භේදයකින් තොරව, පක්ෂය ඔළුවේ තියාගෙන, ජාති ආගම් කුලමල භේද තියාගෙන ඉන්න වෙලාවක් නෙවෙයි. සියලු දෙනාම එකතුවෙලා කටයුතු කරන්න ඕන වෙලාවක්. වනමල් මන්ත්‍රීතුමා, ජයවීර මන්ත්‍රීතුමා ඔබතුමන්ලා කියන දේ නායකයො අහවිද දන්නෙ නැහැ. නමුත් මේ අහිංසක මිනිස්සු පෝලිම්වල දුක් විඳිනවා. පක්ෂ බේදයක් නැතුව රනිල් ජනාධිපතිතුමාටත්, අගමැතිතුමාටත් කොන්දේසි විරහිතව සහයෝගය දෙන්න කියන ඉල්ලීම කරමින්, අපි පක්ෂ භේද තියාගමු ඡන්දයක් ආපු දාට විතරක්. ඒ වගේම හෝමදොල පොලිසිය ගාව කාපට් එක කැඩිලා, අවුරුදු තුන හතරක් ඔබතුමාගෙන් ඉල්ලීම් කලා. ඒත් තවම කිසිම වැඩපිළිවෙළක් ඔබතුමා කලේ නැහැ. සභාපතිතුමනි, ඒවගේ තැනක්වත් හදාගන්න බැරිනම් වැඩක් නැහැ. සියලු දෙනාටම ස්තූති කරමින්, මම නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රී අමර ධනංජය විලේගේ මහතා**

ගරු සභාපතිතුමනි ඔය පොළවල් ටෙන්ඩර කරල දෙන්න බැරිද? අර කලින් දුන්නා වගේ. එහෙම වුනානම්, ඔය ප්‍රශ්නය ගොඩක් අඩු වෙයි නේද?

**ගරු සභාපතිතුමා පිළිතුරු දෙමින්**

අපි ටෙන්ඩර් දැම්මා. නමුත් කවුරුවත් ගන්න ඉදිරිපත් වුණේ නැහැ.

**ගරු මන්ත්‍රී අමර ධනංජය විලේ ගේ මහතා**

දැන් සෙනග වෙළෙන්දො පොළට වැඩිපුර එන නිසා දැන් ටෙන්ඩර් කළොත් ගනීවි නේද?

**ගරු උප සභාපති  එම්.කේ. ගාමිණී සුසන්ත මහතා**

මන්ත්‍රීවරුනි, ඔබතුමාලා ඇප්තොප්වත්ත පොල් ඉඩම ගැන කතා කලා. මෙම පොල් ඉඩමේ පොල් ගස් වෙන්දේසියේදී අරගෙන තිබුනේ අපේ සහෝදර මන්ත්‍රීවරියකගේ මහත්මයා. එතුමත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට විශාල ආදායමක් අරන් දුන්නා.  ඊට පස්සෙ දැන් තමයි පොල් පිළිබඳව කතා වුනේ. ඒ පොල් ඉඩමේම තමයි, අපට කුරුදු  වවන්න කියලා යෝජනාවක්

ගෙනැල්ලා, ඒත් අපි කිව්වා ශුද්ධ කරනකොට අපිට දුන් ප්‍රමාණය සුද්ද කරන්න කියලා. දැන් අපි නැවත වරක් ඒකට j.c.b. එකක් දාලා සුද්ද කරන්න යෝජනා කළා. මම හිතනවා ඒක ස්ථිර නොවුනොත්, ඒ අය රුපියල් එක්දහස් ගානෙ වැඩ කරන්න කැමතිනම් කරන එක හොඳයි. මම හිතන්නේ මේ වෙලාවේ පෞද්ගලික කොන්ත්‍රාත්කරුවෙකුට දුන්න නම්, ඒ අය මේ වෙලාවේ මොන ඉල්ලීමක් කලත්, පැල ගානටයි අය කරන්නේ. ඒකත් අක්කරයක පැළ 5000 ගානේ ඉන්දු වත්, දෙලක්ෂයකට වඩා වැඩි ගණනක් යනවා. ඔබතුමා පැල ගෙනැල්ලා නම්, ඒ පැල ටික සිටුවලා දාන්න කියලා මම ඉල්ලනවා. ඊළඟට අපේ ලක්රුවන් මන්ත්‍රීතුමා කිව්වා. මාසෙන් මාසෙට ගමට ගිහිල්ලා, ශ්‍රමදානයක් ලේස්ති කරලා කරමු කියලා. එතුමා ඒ දේ මේ සභාවේ ආරම්භයේ ඉඳන්ම කියන කතාවක්. ඒ වගේම සභාවේ මාර්ග ගැසට් කරලා පවර ගන්න ඕන කියලා මම දිගින් දිගටම කිව්වා.

ඒවගේම සහබන්දු මන්ත්‍රීතුමා පවසන ආකාරයට පසුගිය සභා වාරවලදී විශේෂ කතා වාරයේදී සාකච්ඡා වුන ප්‍රශ්න සම්බන්ධයෙන්, එහි ප්‍රගති සමාලෝචනය සිදු කිරීම සඳහා (මන්ත්‍රීවරුන්ගේ ප්‍රශ්නවලට පිළිතුරු ලබා දීම ලෙස) න්‍යාය පත්‍රයට විෂයයක් ලෙස ඇතුලු කරනවානම් මෙම ප්‍රශ්නය මග හරවා ගන්න පුළුවන් කියලා මම අදහස් කරනවා. වාහන සර්විස් කිරීමේදී ඉවත් කරනු ලබන දැවි තෙල් සම්බන්ධයෙන් අක්‍රමිකතා සිදු වෙනවා.

ඒවගේම පොළ සම්බන්ධ ප්‍රශ්නයේදී ගුටි කාපු කෙනා ඉදිරිපත් වෙන්නෙ නැත්නම්, එය ප්‍රනකාරීයි. අපට තියෙන ලැජ්ජාව, ප්‍රාදේශීය සභා නිල ඇඳුමෙන් සිටි නිලධාරියෙකුට එම ප්‍රාදේශීය සභාවේම කෙනෙක්ම ගහගන්නවා අරක්කු වලට සල්ලි දුන්නෙ නැහැ කියලා, කොටස් මුදල් බෙදාගන්න බැහැ කියලා විවිධ කතා ඉදිරිපත් වෙනවා. මන්ත්‍රීවරුන්ගේ තත්වයත් පහලටම ඇදලා දාලා තියෙනවා. තල්ගස්වල පොළ ලබන අවුරුද්දෙදිවත් ටෙන්ඩර් කරන්න බලනවා. ගිය අවුරුද්දෙ පොළ ටෙන්ඩර් කිරීමේදී ටෙන්ඩරය ගන්න කෙනෙක් හිටියෙ නැහැ. ඒ නිසා තමයි පොළ සභාවෙන් කරගෙන යන්න තීරණය කළේ. අනවසර වෙළඳාම් කරන අයට අපි විවිධ හේතු හදාගෙන ඔවුන් පොළ ඇතුලට ඇතුලු කරලා යම් කිසි ආදායමක් ලබා ගන්න පුළුවන්. තව කෙනෙක් කිව්වා. උඩුගම පොළ ලංසුව අඩු කලොත් ගන්න අය ඉන්නවා කියලා. අපි ඒ අවශ්‍ය ලිපි ලේඛන හදාගෙන විධිමත්ව කටයුතු කරන්න බලමු. එහෙමනම් මම මීට වැඩිය කතා කරන්න බලාපොරොත්තු වෙන්නෙ නැහැ. බොහොම ස්තූතියි.

**ගරු සභාපතිතුමාගේ මූලාසන කතාව**

ගරු උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රීවරුනි, අදත් මට මූලාසන කතාවේදී ඔබතුමාලා නිතර නිතර ප්‍රශ්න කළ දේ සම්බන්ධව නැවත නැවතත් උත්තර දෙන්න වෙලා. ඔබතුමාලා සමහර අය මාව අපහසුතාවයට පත් කරන්න, මොනවත් නොදන්න අය වගෙයි කතාව. ප්‍රථමයෙන්ම වසන්ත කුමාරගේ මන්ත්‍රීතුමාගේ අවධානයට යොමු කරනවා. ඔබගේ ප්‍රකාශ සම්බන්ධව. ඔබ අද හැසිරෙන්නේ කටුසු චරිතය අරගෙන. මොකද පසුගිය සභා වාරවලදී එක්සත් ජාතික පක්ෂ නායක, වර්තමාන ජනාධිපතිතුමා ගැන ප්‍රකාශ වලට වඩා වෙනස් මතයක් අද ඔබ දරමින් ඉන්නේ. ඒකයි මම කියන්නේ කටුසු චරිතයක් කියලා. සමහරවිට මන්ත්‍රීධූරය ආරක්ෂා කරගැනීමට වන්න පුළුවන්. මේ අද දින ඔබතුමා කරන ප්‍රකාශ, ඔබතුමාට කලින් තමයි අපි සභාවක් හැටියට, රනිල් වික්‍රමසිංහ වර්තමාන ජනාධිපතිතුමාට සුභ පැතුවේ. ඔබතුමාලා එතුමගේ කකුලෙන් ඇදලා, සජිත් මහත්තයා විපක්ෂ නායක කලේ කවුද? එක්සත් ජාතික පක්ෂය දෙකට කඩලා සමගි ජන බලවේගය හැදුවේ කවුද? දැන්ද තේරෙන්නේ, රනිල් මහතා දක්ෂ වැඩකරුවෙක් බව. මම 2015දී කිව්වා. මහින්ද මහත්තයයි, රනිල් මහත්තයයි තමයි එදා ජනාධිපති සහ අගමැති වෙන්න තිබුණේ කියලා. දක්ෂ නායකත්වයක් සහ දක්ෂ

කළමනාකරණය එකතු වුනානම්, අද අපි වැටී තියෙන අභාග්‍යසම්පන්න කාලයක් නොවන්න තිබුනා.

ඒ වගේම, අපේ සමන් මන්ත්‍රීතුමාගේ අදහස්වලින් මම එකක් පිළිබඳව කතා කරනවා. ඒක තමයි හිටපු ජනාධිපතිතුමා ගැන ප්‍රකාශ කළ දේ. එතුමා තමන්ගේ බලතල ඒ ආකාරයට ක්‍රියාත්මක නොකිරීම පිළිබඳව. එය නොකළ නිසා බලයෙන් යැමට සිදු වූ බව. ඇත්ත. එතුමා බලයට පත්වුණාම කිසිම ජනාධිපතිවරයකු නොකළ වෙනසක් කරන්න ගියා. ඒ තමයි, තමා තම පෞද්ගලික නිවසේම රැඳී සිටීම. දෙක, ආරක්ෂාව පිළිබඳව නොතකා පරිවාර වාහන අඩු කිරීම. තුන, ජනතාව ළඟට ගිහින් ප්‍රශ්න ගැන කතා කිරීම. ඒ අවස්ථාවේම පිළිතුරු සැපයීම. හොරකම, වංචාව, දූෂණය නැති කිරීම හෝ අඩු කිරීම වෙනුවෙන්, එවැනි දූෂිත තැන්වලට හමුදා නිලධාරීන් පත්කර, දූෂිත ක්‍රියා නැවැත්වීමට කටයුතු කිරීම. එතුමාගේ වියදම් අඩු කිරීම ආදී බොහෝ දේ කරමින් ගියේ. නමුත් අවාසනාවකට කොවිඩ් වසංගතය ඇවිත් මේ සියල්ල උඩු යටිකුරු වුණා. එයින් පසු ඇති වූ සිද්ධි දාමය තුලයි එතුමාට මේ අරගලකරුවන් යයි කියන අය ප්‍රකාශ කරන අවුරුදු 74 තුළ සිදුවූ වැරදි වලට කරගහන්න සිදුවුණේ. ජනාධිපති මැදුරේ ෆූල් එකේ නාන්න උවමනාවක් තිබුනේ අරගලකරුවන් තමයි එතැනට යොමු කළේ. කාට කාටත් එතුමාගෙන් වුන සේවය අමතක වුනා. දැන් නැවතත් හිස ඔසවන කොවිඩ් නැතිකර, රට යථා තත්වයට ගෙනාවෙ එතුමාගේ තිබුන දූරදර්ශී නායකත්වය නිසා බව අමතක කළා. ඒ අනුව එතුමාව තම මව් රටෙන් යවන්න තරම් අකාරුණිකව, යම් ජනතාවක් පෙළ ගැසුණා. මේ සිදුවීම් මාලාව පිළිබඳව මේ වන විට කරන පරීක්ෂණ වලින් පේනවා. මේවා කාගේ උවමනාවට සිදු වූ දේවල් ද කියා. එතුමා ගත් සමහර තීරණ පිළිබඳව අපි එකග නොවුනත්, මේ තීරණ තම තනි තීරණ නොවන බව පිළිගන්න.

මීට වඩා මම ඒ පිළිබඳව ප්‍රකාශ කිරීමට යන්නේ නැහැ. නමුත් අප සභාවේ ක්‍රියාකාරකම් පිළිබඳ අද පළ වූ අදහස් හා චෝදනා සම්බන්ධයෙන් මම උත්තර දිය යුතුයි. මන්ත්‍රීවරුන් මට කරනා දෝෂාරෝපණ දෙස මම මෙච්චර කල් බලන් හිටියා. සභාපති හැටියට මම සියල්ල දරාගෙන හිටියා. නිලධාරීන් සහ සේවකයන්ගෙ අඩුපාඩු නිසා මම දෝෂාරෝපණයට ලක් වෙන්නෙ කියලා සමන් මන්ත්‍රිතුමා ප්‍රකාශ කළා. පසුගිය කාල වකවානුවේ සිටි සභාපතිවරුන් පිළිබඳව. ඔව් ඇත්ත, ඒ අය හොඳයි. ඒ අයට අද වාගෙ ප්‍රශ්න තිබුණෙ නැහැ. කවුරුවත් ඇඟිලි ගැහුවෙ නැහැ. තමන්ගෙ පාඩුවේ තමන්ගේ වැඩ ටික කරගෙන ගියා. එදා මන්ත්‍රීවරු කිහිපදෙනයි සිටියේ. ඔවුන්ගේ උවමනා එපාකම් ඉටු කරන්න එදා බැකෝ රථය තිබුණා. අදට වඩා ආර්ථිකය ශක්තිමත්ව තිබුණා. මැති ඇමති උපකාර තිබුණා. අවශ්‍ය මුදල් ප්‍රතිපාදන ලැබුණා. ඒ අනුව එයාලා වැඩ කළා. ඒ අනුව හිටපු සභාපතිවරු තමන්ගේ කාලවකවානුව තුළ, අඩු වැඩි වශයෙන් සභාවට ලැබුණු ප්‍රතිපාදන වලින් වැඩ කළා. ඒ හැම සභාපතිවරයෙක්ගේම කාලය, සහබන්දු මහතාගේ කාලය 1/3 ක් අරුණම, තමන්ගේ පක්ෂයේ ආණ්ඩු බලය තිබුණ කාලය. ඔබ අපි කවුරුත් දන්නවා. මා සභාපතිකමට පත්වෙනකොට තිබුන ආණ්ඩුව වසර දෙකක්, එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව යටතට. අනෙක් වසර කොවිඩ් වසංගතයත් එක්ක. ඊළඟට අරගලය සමග. මෙවැනි කාලවකවානුවක තමයි අපි මේ තරම් දුරට හෝ වැඩ කරගෙන යන්නේ. ආදාහනාගාරය අපට ලැබුණේ අපි හොයාගෙන ගිහින්, මගේ ඉල්ලීමකට. තල්ගස්වල වෙළඳ සංකීර්ණය මගේ ඉල්ලීමක්. මෙම ඉදිවන ඉඩම් ලැබුණේ, මගේ ඉල්ලීමකට. තවත් ඉඩම් කිහිපයක් අත්පත් කර ගැනීමට ඉදිරියේදී කටයුතු කරනවා. ඇප්තොප්වත්ත ඉඩමත් ඒ ආකාරයට නීත්‍යානුකූලව අත්පත් කරගන්න කටයුතු සිදු කරමින් ඉන්නේ. මෙහි සඳහන් නොකළත්, මාර්ග සංවර්ධන ව්‍යාපෘති හැර, ලක්ෂ ගාණක වෙනත් සංවර්ධන කටයුතු මේ අප බල ප්‍රදේශයේ සභාව මැදිහත් වී කරලා තියෙනවා. ඒ අනුව අපේ සභාව මගේ නායකත්වයෙන් වැඩ නොකළේ යැයි කියන්න

කිසිවකුට බැහැ. තවද මම කිසිම කෙනෙකු විවේචනය කිරීමටත් කැමති නැහැ. බැරිම තැන එසේ වුනොත් හැර.

ගරු මන්ත්‍රීවරුනි, තවද ගරු මන්ත්‍රීවරුන්ගෙන් ප්‍රකාශ වුණා. සභාවේ වෙන අක්‍රමිකතා සම්බන්ධයෙන්. මේ සියල්ලට වගකිව යුත්තා සභාපති වන මමය කියලා. කියමනක් තියනවනේ සේරම කුණු බේරුවල් බොක්කට කියලා. මටත් ඒ ආනිසංසය තමයි. මේ චෝදනා වලට ඍජුව නොවුනත්, වක්‍රව මමත් වගකිව යුතුයි. ඇත්ත. නමුත් මේ සභාව තුළත්, පිටත සිදුවන දේවල් පිළිබඳවත් මම නිසියාකාරව දැනුවත් වූවා නම්, ඒවට නිසි ක්‍රියාමාර්ග ගැනීමට පසුබට වන්නේ නැහැ. අද මෙහිදී මන්ත්‍රීවරුන්ගෙන් දැනුවත් වූ කාරණා සමහරක් ඒවා මම දැනුවත් වුණේ පිටින්. එකක් තමයි පසුගිය සඳුදාවක උඩුගම පොළේ වූ ඒ සිදුවීම. ඒ පිළිබඳව මා දැනුවත් වූ විගස, එදින පොළ භූමියේ සිටියා යැයි මා දැනුවත් කර කෙනා කී පරිදි, තරංග මන්ත්‍රීතුමා හා ධර්මසිරි මන්ත්‍රිතුමා එම භූමියේ ඉඳලා තියෙනවා. තරංග මන්ත්‍රීතුමාගෙන් ඒ ගැන රාත්‍රියේදී දුරකථනයෙන් මේ පිළිබඳව කරුණු විමසුවා. නමුත් එතුමත් ප්‍රකාශ කළේ එවැනි සිදුවීමක් පොලේ සිදු වී ඇති බවයි. ඒ අනුව මම සභා ලේකම්තුමියව දැනුවත් කළා. මේ පිළිබඳව සොයා බලා, මට වාර්තා කරන්න කියලා. රාජකාරි කරන අවස්ථාවේ සභා නිලධාරියෙකුට යම් සිදුවීමක් වුණා නම්, පොලීසියේ පැමිණිල්ලක් දමන්නත් මම එතුමියට දැනුම් දුන්නා. නමුත් මට පසුව දැන ගන්න ලැබුණා. යම් සිදුවීමක් සිදුවී ඇති බවත්, එය දෙගොල්ලොම සමථයට පත් වී ඇති බවත්. නමුත් මම කිව්වා එහෙම වුණත්, මෙයට සම්බන්ධ සියලු දෙනාගෙන් ප්‍රකාශ ලබාගෙන, වාර්තාවක් මට දෙන්න කියලා. ඒ වගේම වනමල් මන්ත්‍රීතුමා ඇසුවා. පාපැදියක් නැති වීම පිළිබඳව. ඔබතුමා පසුගිය සභා වාර්තාව හොඳින් පරිශීලනය කරානම්, ඒ පිළිබඳව දැනුවත් වෙන්න ඕන. කවුරුත් කියන පලියට මෙම සභාව අපහසුතාවට පත් කරන කතා කියන්න එපා.

ඊලගට පොළවල්වල පොල කාසි එකතු කිරීම පිළිබඳව, යම් ප්‍රශ්නකාරී තත්වයක් තියෙනවා. මේ සඳහා සභා නිලධාරීන් යවන්නෙ මට මුදල් එකතු කර ගන්නවත්, මගේ කෙනෙක් මුදල් එකතු කරගන්නවත් නෙවෙයි. මම මුදල් එකතු කිරීම සඳහා සහයෝගයට තවත් නිලධරයකු යොදවා තියෙන්නෙ තාවකාලිකව. මෙහි ඇත්ත නැත්ත දැනගැනීමට. මුදල් එකතු කිරීමේ යම් ගැටළු සහගත තත්වයක් පවතින බව පේනවා. ඒ පිළිබඳව ඉදිරියේදී ඇවැසි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනවා. මේ වන විටත් අදාල වෙළඳුන් පොළ තුලට යොමු කිරීමට සැලසුම් කරමින් ඉන්නෙ. ඉදිරියේදී කොරෝනා වසංගතයත් සමග පොලේ ඇතිවූ පසුබෑම යථා තත්ත්වය පත්ව සභා ආදායම යම්තාක් දුරට වැඩි කරගන්න උත්සාහ ගන්නවා. සමස්ත නිලධාරීන් නොවුනත්, සමහර සුළු නිලධාරීන් සහ සේවකයන්ගේ වැරදි ක්‍රියාකාරකම් වලට, ඉදිරියේදී නිසි ක්‍රියාමාර්ග ගැනීමටත් පසුබට නොවන බව සඳහන් කරන්න කැමතියි.

ගරු මන්ත්‍රීවරුනි, අපේ සභාවේ කතා වෙන ප්‍රශ්න වන්නේ, පොළ, ඇප්තොප්වත්ත, වාහන සහ කම්කරුවන් පිළිබඳවයි. පොල පිළිබඳව ඉහත කතා කළා. ඇප්තොප්වත්ත පිළිබඳවත් කතා කළා. එහි මේ වන විට වගා කරමින් යන කුරුඳු පිළිබඳවත් කථා කළා. මේ වන විට පැළ 2500 ක් පමණ සිටුවා අවසන්. තව පැල 5000 ක් පමණ සිටුවීමට තිබෙන බවයි මා දැනුවත් වුණේ. එම පැළ ඉන්දීම සඳහා, භූමිය නෙලීම සඳහා, කම්කරු ශ්‍රමයට වඩා ස්කැවේටර් මැෂිමක් දමා එළි කිරීම සුදුසු බව තාක්ෂණ නිලධාරී නිර්දේශ කර ඇති නිසා, ඒ අවශ්‍ය ඇස්තමේන්තුව මේ සභාවට ඉදිරිපත් කළේ. නමුත් සභා කැමැත්ත වී ඇත්තේ වෙනස් ආකාරයකට බැවින්, අද සභාවේ ජයවීර මන්ත්‍රීතුමා භාර ගත් පරිදි, ඉදිරියේදී එම බිම් කොටස සුද්ධ පවිත්‍ර කොට, පැළ ඉන්දීම සිදු කිරීමට කටයුතු කරනවා. උප සභාපතිතුමා පැවසූ පරිදි අපි ඇප්තොප්වත්ත භාර ගනිද්දී, මෙහි ඇති පොල් ගස් වල ආදායම් වෙන්දේසි මගින් ලබාගෙන තිබුණේ වර්තමාන මෙම

සභාවේ මන්ත්‍රීවරියෙකුගේ මහත්තයා. නමුත් අපි පත් වූවාට පසුව, එම වෙන්දේසියෙන් එය අපි ලබාගෙන, පොල් එළදාව සභාවට ගත්තා. නමුත් අපි සිතා සිටි ආකාරයට විශාල ලාභයක් ලබා ගැනීමට අපහසු වුණා. පසුව පොල් මිලත් අඩු වූ නිසා පසු වෙන්දේසිවලදි කවුරුවත් එය මිලදී ගත්තේ නැහැ. මෙම පොල් වල ආදායම අපට ලැබුණත්, නොලැබුණත්, අපේ සභාවට පාඩුවක් නැහැ. තවම මෙම පොල්ගස්වල අයිතිය ප්‍රාදේශීය ලේකම් සතු නිසා.

ඒ වගේම උප සභාපතිතුමාගේ ඉල්ලීම තමයි සභාවේ මාර්ග ගැසට් කිරීමක් විය යුතුයි කියලා. මේ පිළිබඳව එතුමා වාර ගණනකදී මේ සභාවේ යම් යම් කාරණා මතු කළා. මම මේ සම්බන්ධව නිලධාරීන් දැනුවත් කලත්, එහි ප්‍රගතියක් නොමැති බව පෙනී යනවා. මෙම කාරණය එතරම් පහසු කාරණයක් නොවුනත්, එහි ඉදිරි ප්‍රගතිය පිළිබඳව මා සොයා බලා, පිළිතුරක් ලබා දෙන්නම්. මේ අතරම කොම්පෝස්ට් නිෂ්පාදනය පිළිබඳව, සහබන්දු මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයට උත්තර මීට ප්‍රථම සභා වාර වලදිත් දුන්නා. නමුත් මේ පිළිබඳව දිගින් දිගටම ප්‍රශ්න කරන්නේ මෙතන  අපි නොදන්න අක්‍රමිකතා සිදුවන බවයි. ඒ කියන්නේ හොරකම් වන බවයි. හැමතැනම හොරකම, වංචාව. පොළට ගියත් හොරකම. වත්තට ගියත් හොරකම. වාහන ගැනකතා කලත්, හොරකම. ඉතින් මේවා මේ කියන ආකාරයට වෙනවනම්, මෙය නැති කිරීම මට තනියෙන් කිරීමට නොහැකි බවත්, ඒ සඳහා ඔබතුමාලා මෙතන කතා කිරීමෙන් පමණක් නොව, ක්‍රියාවෙන් මා හට සහයෝගය දක්වන ලෙසත් ඉල්ලනවා. ඒ වගේම ලක්රුවන් මන්ත්‍රීතුමාගේ කාලෝචිත යෝජනාව සඳහා ප්‍රදේශයක් නම් කොට, ශ්‍රමදානය කිරීමට අපි කවුරුත් එකතු වෙලා ආදර්ශයක් දෙමු. ඒ වගේ අද දින ගේ සියලුම ගරු මන්ත්‍රීවරුන් සහභාගි වීම සේම, සභාවේ විනය ආරක්ෂා කරන්නත්, සභා නීති රීති පිලිපදින්නත්, මූලාසනයට ගරු කරන්නත්, ලබන සභාවට පැමිණ සහයෝගය ලබා දෙන්නත් කියා ඉල්ලමින්, අද සහභාගී වූ සියළුදෙනාට ලේකම්තුමිය ඇතුළු නිලධාරීන්ටත්, සභාවේ සියලු දෙනාටත් සුභ අනාගතයක් පතමින්, මා නිහඬ වෙනවා.

සභාපති,
නාගොඩ ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී දිනය:-